# Building *Prosperity*

**සෞභාග්‍යය ගොඩනැඟීම**

සුන්දර මතකයන් එක් කළ හැකි ස්ථාන නිර්මාණය කිරීමේදී අප සාධනීය වේ. බිත්ති සතරකට සහ වහලයකට සීමා නොවූ සැබැවින්ම තමන්ගේම යැයි කිව හැකි ඉඩකඩක ජීවත් වීමට සිහින දකින අයට සාර්ථකත්වය, ජීවන ප්‍රමිති, සෞඛ්‍ය සහ සංතෘප්තිය ගොඩනඟාගැනීමට අප නිරන්තරව සහයෝගය ලබා දෙයි. අළුතින් පවුලක් ආරම්භ කර ඇති දැඩි කරමින් ජීවන ගමනට වටිනාකම් නිර්මාණය කිරීමට නිවහනක්. ජාතික නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව - ජාතියක සෞභාග්‍යය ගොඩනැඟීම.

HDFC BANK
The Bank for your Home

නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව | වාර්ෂික වාර්තාව 2015

මූල්‍ය උද්ධෘතයන් **2**

සභාපතිතුමාගේ පණිවුඩය **5**

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ සමාලෝචනය **9**

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව **12**

විගණකාධිපතිගේ වාර්තාව **17**

ලාභ හෝ අලාභ ප්‍රකාශනය **19**

වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය **20**

මූල්‍ය තත්ත්ව විස්තරය **21**

ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය **22**

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය **23**

ගිණුම්කරණ ප්‍රතිපත්ති **24**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් **28**

මූල්‍ය උපකරණ මිනුම්කරණය **45**

ප්‍රාග්ධන ප්‍රමාණාත්මකභාවය **47**

අවදානම ගැලපූ - ශේෂ පත්‍ර අනාවරණයන් **48**

# මූල්‍ය උධෘතයන්

| | 2015<br>රු. මිලියන | 2014<br>රු. මිලියන | Change<br>% |
|---|---|---|---|
| **වර්ෂය සඳහා ප්‍රතිඵල** | | | |
| ආදායම | 4,909 | 4,566 | 8 |
| බදු පෙර ලාභය | 962 | 777 | 24 |
| බදුකරණය සඳහා ප්‍රතිපාදන | 469 | 402 | 17 |
| බදු පසු ලාභය | 493 | 375 | 32 |
| රජයට ආදායම | 512 | 438 | 17 |
| **වර්ෂය අවසානයේදී** | | | |
| කොටස් හිමියන්ගේ අරමුදල | 3,364 | 2,886 | 17 |
| ගණුදෙනුකරුවන්ගෙන් ලද තැන්පතු | 28,593 | 24,479 | 17 |
| ගණුදෙනුකරුවන්ට ලබාදුන් දල ණය සහ අත්තිකාරම් | 27,316 | 23,899 | 14 |
| මුළු වත්කම් | 41,913 | 34,418 | 22 |
| **සාමාන්‍ය කොටසක් සඳහා තොරතුරු** | | | |
| ඉපයුම (මූලික) (රු.) | 7.62 | 5.79 | 32 |
| **මූල්‍ය අනුපාත** | | | |
| කොටස් හිමියන්ගේ අරමුදල් වල සාමාන්‍ය මත ප්‍රතිලාභ (%) | 15.78 | 13.72 | 15 |
| සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ (%) | 1.29 | 1.21 | 7 |
| මුළු වත්කම් වලට කොටස් හිමියන්ලේ ප්‍රාග්ධනය (%) | 8.03 | 8.38 | (4) |
| **ව්‍යවස්ථාපිත අනුපාත** | | | |
| ද්‍රවශීල වත්කම් (%) | 35.03 | 28.90 | 21 |
| ප්‍රාග්ධන ප්‍රමාණාත්මකභාවය | | | |
| මට්ටම 01 (%) - අවම අවශ්‍යතාවය 5 % | 13.67% | 13.78% | (1) |
| මට්ටම 02 (%) - අවම අවශ්‍යතාවය 10 % | 12.18% | 12.92% | (6) |
| **වෙනත් තොරතුරු** | | | |
| ශාඛා | 38 | 36 | 6 |
| සේවක සංඛ්‍යාව | 561 | 477 | 18 |
| ණය ශ්‍රේණිය - ෆිච්/ලංකා රේටින් | BBB(lka) Stable | BBB+ Stable | |




**ණය අත්තිකාරම් හා තැන්පතු**




**දළ ආදායම සහ පොලී ආදායම**




**බදු පෙර ලාභය සහ බදු පසු ලාභය**




**මුළු වත්කම්**




**වත්කම් මත ප්‍රතිලාභය හා කොටස් හිමියන්ගේ අරමුදල් වල සාමාන්‍ය මත ප්‍රතිලාභ**



# සභාපතිතුමාගේ පණිවුඩය

2015 වර්ෂයේදී බැංකුව සඳහා වඩාත් ඵලදායී වර්ෂයක් අවසාන කලා සේම අප අනාගතය කෙරෙහි අවධානය යොමුකල යුතු යැයි මා විශ්වාස කරමි. ඉහල යන පොළී අනුපාත පසුබිමක් තුළ සියළුම බැංකු සහ මූල්‍ය ආයතන සමාන නිෂ්පාදිත සහ සේවා සැපයීම නිසා ශ්‍රී ලංකාවේ මූල්‍ය පරිසරයේ ඇති තරඟ කාරිත්වය වර්ධනය වී ඇත.

එවැනි තත්වයක් තුල සීමිත නිෂ්පාදිත කලඹක් ඇති HDFC බැංකුව වැනි විශේෂිත නිවාස බැංකු තරඟකාරිත්ව වාසි ලබා ගන්නේ කෙසේද ? අනෙකුත් බොහෝමයක් මූල්‍ය ආයතන නිවාස මූල්‍ය පහසුකම් සැපයීම තුල HDFC බැංකුව තවදුරටත් ශ්‍රී ලාංකික ජනතාවට ප්‍රයෝජනවත් වන්නේ කෙසේද ? සභාපතිවරයා ලෙස මා ද ඇතුළුව අධ්‍යක්ෂ මණ්ඩලය මුහුණ දෙන විශාලම ගැටළු ඒවාය.

2013 වර්ෂයට පෙර, සම්පූර්ණයෙන්ම නිවාස මූල්‍යනය පදනම් කරගත් ව්‍යාපාර ආකෘතියක් මත HDFC බැංකුව ක්‍රියාත්මක විය. ඒ තුළින් ඉහළ මූල්‍ය හා වෙළෙඳපොල අවදානමක් බැංකුවට නිරාවරණය කරන ලදී. 2011 වර්ෂයේදී මාගේ ධූරකාලය තුල HDFC පනත සංශෝධනයෙන් පසුව නිවාස මූල්‍යනයට අමතරව විවිධාංගීකරණය වූ නිෂ්පාදිත කලඹක් බැංකුව තුළ ස්ථාපිත කරන ලදී. ප්‍රවර්තන මූල්‍ය වර්ෂය තුලදී එම ක්‍රියාවලිය තහවුරු කරන ලදී. එය අපගේ මූල්‍ය අවදානම් තත්ත්වය අවම කිරීමටත්, තරඟකාරිත්වය වර්ධනය කිරීමටත් සැලකිය යුතු ලෙස දායක විය. කෙසේ වෙතත් විශේෂිත බැංකුකරණ බලපත්‍රය යටතේ අප බැංකුවේ ව්‍යාපාරික විෂය පථය තවමත් සීමිත වී ඇත.

### වර්ධනය සඳහා අවස්ථාවන්

HDFC සන්නාමය තුල විශේෂත්වයක් පැවතියද සීමිත වෙළෙඳපොළ ආකර්ශණයක් ඇත. වර්තමානයේදී අවිධිමත් වෙළෙඳපොලෙහි දෛනික වැටුප් ලබන අඩු ආදායම්

**"අපගේ සංවර්ධන සැලසුම් සමඟ තවදුරටත් ශ්‍රී ලාංකීය මූල්‍ය වපසරිය තුළ ශක්තිමත් සහ වැදගත් තරඟකරුවකු ලෙස රැඳීසිටීමේ හැකියාව අප සතු වේ. කෙසේ වෙතත් රටෙහි එකිනෙකට වෙනස් නිවාස පහසුකම් සපයන නියෝජිතයින්ට දායකත්වය සැපයීම සඳහා අවස්ථාවන් හඳුනාගනිමින් සංවර්ධනය කළ ජාතික නිවාස ප්‍රතිපත්තියක් ඇතිනම් රටට අපගේ දායකත්වය සැලකිය යුතු අන්දමින් වර්ධනය කර ගත හැකිය. මෙවැනි ප්‍රතිපත්ති රාමුවක් තුළින් වඩාත් ඵලදායී නිවාස සංවර්ධනය හා නාගරීකරණය සඳහා විවිධ රාජ්‍ය නියෝජිත ආයතන වල විශේෂඥතාවය සන්නද්ධ කළ හැකිය. HDFC බැංකුවටද ඕනෑම කෙනෙකුට දැරිය හැකි පරීක්ෂා කරන ලද නිවාස අකෘතියන් තුළින් දායක විය හැකිය."**

උපයන්නන්ගේ සිට මධ්‍ය හා ඉහල ආදායම් ලබන වෘත්තිකයන් දක්වා පැතිරෙන මධ්‍ය හා අඩු ආදායම් කාණ්ඩ තුල අපගේ ප්‍රධාන වෙළෙඳපොල කොටස් විහිදී ඇත. බැංකු පෝලිම් තුල කාලය නාස්ති කිරීමට අකැමැති නිතීඥවරු හා අනෙකුත් වෘත්තිකයන් මෙන්ම අනෙකුත් බැංකු විසින් නොසලකා හැර ඇති පිටකොටුවේ නාට්ටාමීන් පවා අපගේ Palmtop බැංකුකරුවන් හරහා HDFC බැංකුව සමග ශක්තිමත් සබඳතාවක් ගොඩ නඟාගෙන ඇත. එම නිසා මා විශ්වාසකරනුයේ අපගේ හොඳම උපාය විය යුත්තේ සුදුසු පාරිභෝගික කණ්ඩායම්වලට ගැලපෙන ලෙස සැකසූ නිෂ්පාදිත හා සේවා සැපයීමයි. ප්‍රාථමික බෙදාහැරීමේ මාධ්‍යක් ලෙස අපගේ Palmtop බැංකුකරුවන් භාවිතා කොට මෙය කාර්යක්ෂම ලෙස සිදු කල හැක.

පවතින නිවාස සම්බන්ධ සංඛ්‍යා දත්ත වලට අනුව නිවාස උසස්කිරීම් ක්ෂේත්‍රයේ ඉෂ්ඨ නොවූ අවශ්‍යතා බොහෝමයක් පෙන්නුම් කෙරෙන අතර රටෙහි නාගරික හා ග්‍රාමීය නිවාස විශාල ප්‍රමාණයක් ව්‍යුහාත්මක වශයෙන් අනාරක්ෂිත මෙන්ම ආරක්ෂාව, සනීපාරක්ෂාව හා පෞද්ගලිකත්වය සපයා නැති නිවාස වේ.

මා විශ්වාස කරනුයේ මේ තත්ත්වය තුල එයට සහාය වීම සඳහා HDFC බැංකුව නියමාකාරයෙන් ස්ථානගත වී ඇති බවයි. ප්‍රමාණයෙන් විශාල වුවත් අප සමාජයේ මෙම නොපෙනෙන අංශය සඳහා කුඩා, වඩාත් ගැලපෙන ලෙස සැකසූ නිවාස ණය පහසුකම් සැපයීමට අපට හැකියාව ඇත. අපට දැන් ඔවුන්ගේ පවුල් වල ආදායම සහ ජීවන තත්වය සංවර්ධනය කිරීමට උපකාරී වන කල්බදු පහසුකම්, උකස් පහසුකම් හා සුළු ව්‍යාපාර ණය වැනි අනෙකුත් මූල්‍ය නිෂ්පාදිත වලින් ද සහාය වීමට හැකියාව ඇත.

නැවත මා විශ්වාස කරනුයේ HDFC ශාඛා වල උපකාරයෙන් බැංකුවේ Palmtop ජංගම ඒකකයට මෙම අවස්ථාව ග්‍රහණය කර ගැනීම සඳහා ප්‍රධාන භූමිකාවක් විය හැකි බවයි.

## සභාපතිතුමාගේ පණිවුඩය

### අවදානම වෙත ආමන්ත්‍රණය කිරීම

මීට පෙර අපගේ ආදායමෙන් 96% ක්ම නිවාස මූල්‍ය පදනම මත උපයා ඇත. 2015 වර්ෂය තුලදී මෙම ප්‍රධාන ව්‍යාපාර අංශය වෙනස් වී නිවාස මූල්‍යනය 89% කින් සහ ඉතිරිය අනෙක් නිෂ්පාදන වලින් සැකසී ඇත. 2017 වන විට අප මෙම තත්වය 70:30 ලෙස සමබර කිරීමට බලාපොරොත්තු වේ. අපගේ මෙම ආදායම නැවත සමතුලිත කිරීම තුලින් බැංකුවට ආවේණික අවදානම් ස්වභාවයන්ට සාර්ථකව මුහුණ දිය හැකි බවයි. ඒ තුලින් ශ්‍රී ලංකා මහ බැංකුව අධිපතිතුමා පැවසූ ආකාරයට බැංකුවේ ණය කලඹෙන් 25% සුළු හා මධ්‍ය පරිමාණ අංශ සදහා ණය ලබාදීම යන රජයේ ප්‍රතිපත්තියටද සාර්ථකව ආමන්ත්‍රණය කල හැක. 2015 නොවැම්බර් මාසයේදී අප රු. බිලියන 04 ක් වටිනා ලැයිස්තුගත ණයකර නිකුත් කරන ලදී. මේ තුලින් අපගේ වත්කම් පදනම රු. බිලියන 41 ක් දක්වා වර්ධනය කරගැනීමට උපකාරී විය. කෙසේ වෙතත් ශ්‍රී ලංකා මහ බැංකුවේ නියමය වන රු. බිලියන 05 ට තවමත් අපට හිඟයක් පවතී. 2017 වර්ෂයේ දී අපගේ වර්තමාන ප්‍රාග්ධන වර්ධන සැලසුම් හරහා මෙම පරතරය පියවීමට බලාපොරොත්තු වේ. අප මේ වන විට ඒ සදහා පවතින විකල්ප තවදුරටත් අධ්‍යනය කිරීම සිදුකරයි. කෙසේ වෙතත් ණයකර නිකුතුන් තුලින් අරමුදල් සපයා ගැනීම හා ණය මාධ්‍යය අතර පරිණතභාවයේ නොගැලපීම මත අපගේ ශේෂපත්‍රයට වූ පීඩනය අඩුකිරීමට හැකිවිය.

2015 වර්ෂයේදී බැංකුවේ පවතින ප්‍රධාන බැංකුකරණ පද්ධතිය වෙතද අවධානය යොමු කරන ලදී. වඩාත් හොඳ පාරිභෝගික සේවාවක් ලබාදීම සඳහා නිෂ්පාදිත සහ ව්‍යාපාර මාර්ග සංවර්ධනයට පහසුකම් සැපයීම සඳහා බැංකුවේ පවතින ප්‍රධාන තොරතුරු තාක්ෂණ පද්ධතිය විශිෂ්ඨ ලෙස ශක්තිමත් කිරීමට බැංකුව කටයුතු සිදුකරන ලදී. 2016 වර්ෂයේ අග වන විට මෙහෙයුම්වලට යොදාගත හැකි නවීන පද්ධතියක් සංවර්ධනය කිරීමේ කටයුතු මේ වන විට සිදුකරමින් පවතී. මේ තුලින් ජනතාවට උසස් සේවාවන් සැපයීමටත් බැංකුවට සිදුවිය හැකි හානිවලින් ආරක්ෂාවීමටත් උපකාරී වේ.

මෙම සිදුවන වෙනස්කම් තුළින් බැංකුවේ මානව සම්පත් අවශ්‍යතා බොහොමයක් ඉස්මතු කරන ලදී. මේ වන විට HDFC අධ්‍යක්ෂ මණ්ඩලය තුළ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ විශේෂඥ දැනුමක් ඇති සාමාජිකයෙකු නොමැත. එසේම කළමණාකරනය හා සේවක මණ්ඩලය සතු තොරතුරු තාක්ෂණ දැනුමද ඉතා සීමිතය. 2016 වර්ෂයේදී තොරතුරු තාක්ෂණ විශේෂඥයින් අධ්‍යක්ෂ මණ්ඩලයට ඇතුලත් කිරීම තුළින් මෙම තත්ත්වය සඳහා පියවර ගැනීමට මා බලාපොරොත්තු වෙමි. එසේම උච්ඡාවචනය වන පොළී අනුපාත පවතින පරිසරයක බැංකුවේ වත්කම් හා වගකීම් කළමණාකරනයද ශක්තිමත් කිරීමටද අප සැලසුම් කර ඇත.

අනෙක් සැලකිය යුතු ක්ෂේත්‍රය වන්නේ භාණ්ඩාගාර කළමණාකරනයයි. 2016 මූල්‍ය වර්ෂය තුළ විදේශ ව්‍යවහාර මුදල් වල උච්ඡාවචනය හේතුවෙන් ලාභදායිත්වයට විශාල බලපෑමක් ඇති කිරීමට බොහෝ දුරට ඉඩ ඇත. වර්තමානයේ වෙනස් වන පොළී සහ විදේශ ව්‍යවහාර මුදල් අනුපාත පරිසරයක් තුළ HDFC බැංකුවේ භාණ්ඩාගාර කළමණාකරනය තුළ විශේෂඥතා ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය වනු ඇත.

එසේම අපගේ මානව ප්‍රාග්ධනය තුළින්ද අනාගතය සැලසුම් කල යුතුය. අපගේ Palmtop බැංකුකරුවන් නිෂ්පාදිත බෙදාහැරීමේ හා අලෙවිකරණයේ ප්‍රධානම මාධ්‍යය වී ඇත. ඔවුන් තුළද යම් සංවර්ධනයක් සිදුකිරීමේ අවශ්‍යතාවය ඇත. එම නිසා දැනට සිටින අපගේ ප්‍රාදේශිය දක්ෂතා කණ්ඩායම් සහ Palmtop බැංකුකරුවන්ද ඇතුලත් සේවක මණ්ඩලය යොදාගෙන සමස්ථ බැංකුව සඳහා විධිමත් වෘත්තීය සංවර්ධන ක්‍රියාවලියක් හා අනුප්‍රාප්තික ක්‍රමවේදයක් සංවර්ධනය කිරීමට මා බලාපොරොත්තු වෙමි.

මා විශ්වාස කරනුයේ රැකියාවේ විහිවිද වර්ධන පථය තුළින් බැංකුව තුළ වඩා හොඳ කම්කරු සබඳතා සඳහා දායකත්වය සපයන බවය. මා විසින් වෘත්තීය සමිතිගත වීමේ අයිතීන් සඳහා සහයෝගය ලබාදෙන අතර සේවකයින්ද HDFC බැංකුව මහජන වත්කමක් ලෙස සැලකිය යුතුය.

මාගේ මෙහෙයුම වනුයේ කොටස් හිමියන්ට, සේවකයින්ට, පාරිභෝගිකයින්ට සහ මහජනතාවට ප්‍රතිලාභ අත්කර දෙන අකාරයට බැංකුවට වර්ධනය විය හැකි සංස්කෘතියක් බැංකුව තුළ ස්ථාපිත කිරීමයි.

HDFC බැංකුව හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ස්වේච්ඡාවෙන් ඒකාබද්ධ වීම සඳහා වූ රජයේ යෝජනාව පිළිබඳවද HDFC බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමණාකරනය විසින් සාකච්ඡා කරමින් සිටී. බැංකු දෙකෙහිම සේවක මණ්ඩලයේ සහ අපගේ පෞද්ගලික අංශයේ කොටස් හිමියන්ගේද අයිතිවාසිකම් සැලකිල්ලට ගනිමින් රජයේ මෙම වඩා වැඩදායී තීරණය සඳහා සහයෝගය ලබාදීමට HDFC බැංකුව සැදී පැහැදී සිටී.

### අපගේ ප්‍රධාන පාර්ශවකරුවන්ගේ බැඳීම් අවබෝධ කරගැනීම

පසුගිය වර්ෂ කිහිපය තිස්සේ HDFC බැංකුවේ ව්‍යාපාර ආකෘතිය වූ නිවාස මූල්‍ය ඒකකය යන ස්වභාවයේ සිට නිවාස සහ අනෙකුත් මූල්‍ය සේවා සපයන්නකු ලෙස වෙනස් විය. මේ ඔස්සේ වර්ධනය කරා යාමේදී අධ්‍යක්ෂ මණ්ඩලය වන අපටද ඉහළ කළමණාකරණයටද HDFC බැංකුවේ වර්ධනය වන ග්‍රාමීය පාරිභෝගික පදනම පිළිබඳ මනා අවබෝධයක් තිබීම ඉතා වැදගත් කරුණක් වනු ඇත.

2016 වර්ෂයේදී මම සහ HDFC ඉහළ කළමණාකරනය අපගේ ප්‍රාදේශීය පාර්ශවකරුවන් මුණ ගැසීම සඳහා දීප ව්‍යාප්ත මහජන සබඳතා අභ්‍යාසයක් ක්‍රියාවට නැංවීම සඳහා බලාපොරොත්තු වේ. එහි මූලික අරමුණ වන්නේ ප්‍රජාව සමඟ තනි තනි වශයෙන් මුණගැසී ඔවුන්ගේ අවශ්‍යතා වලට අනුව අපගේ නිෂ්පාදිත හා සේවා ව්‍යුහය සකස් කරන අකාරය පිළිබඳ අවබෝධයක් ලබාගැනීමයි. පවතින සංඛ්‍යා දත්ත වලට අනුව රටෙහි ජනතාවගෙන් 38% පමණ බැංකු වෙත නොගොස් තම මූල්‍ය අවශ්‍යතාවන් පොළියට මුදල් ලබාදෙන අවිධිමත් මාර්ග සඳහා යොමු වී ඇත. එයට හේතුව ලෙස මා විශ්වාස කරනුයේ බැංකුකරණයේ පැතිකඩින් ඔවුන්ගේ අවශ්‍යතා පැහැදිලිව හඳුනාගන්නේ කෙසේද යන්න නොදනී යන්නයි. ලෝක බැංකු සංඛ්‍යා දත්ත වලට අනුව ජනගහනයෙන් 40% ක් රු. 225 ක් පමණ දෛනික වැටුප් ලබමින් ජීවත් වන පිරිසකි. එවැනි තත්ත්වයක සිටින මිනිසුන්ට පාරිභෝජන වියදම් ඉක්මවා ඉතිරි කිරීමට තරම් අතිරික්තයක් නැත. එම නිසා මා විශ්වාස කරනුයේ එම පිරිස් අප සොයා ඒම වෙනුවට අප ඔවුන් වෙත ළඟාවීමට විචක්ෂණ විය යුතුයි යන්නයි. දෙවන අරමුණ වනුයේ කොළඹ සහ ප්‍රාදේශික වල සිටින HDFC කණ්ඩායම් අතර අන්තර් පුද්ගල සබඳතා සංවර්ධනය කිරීම හා ඔවුන්ගේ කණ්ඩායම් හැඟීම වර්ධනය කරගැනීමට පහසුකම් සැපයීමයි. එසේම ඔවුන්ගේ ප්‍රදේශ වල ප්‍රජාව පිළිබඳ අපගේ ප්‍රාදේශීය කණ්ඩායම් සතු දැනුම සහ අවබෝධය අපගේ උපායන් සහ නිෂ්පාදිත සංවර්ධනයේදී යොදාගැනීම තුළ වේගවත් සංවර්ධනයකට මාර්ගය විවර වනු ඇත.

## සාංගමික යහපාලනය

ශ්‍රී ලංකා මහ බැංකු නියමයන්ට අනුව සමස්ථ යහපාලනය ශක්තිමත් කිරීමට හා වඩා හොඳ අවදානම් කළමණාකරනයක් සඳහා වූ බැංකුවේ සාංගමික යහපාලන පද්ධතිය සමාලෝචනය කිරීමට මා බලාපොරොත්තු වේ. ව්‍යුහය තුළ සෑම මට්ටමක් සඳහා වූ අවදානම් අවම කිරීම සඳහා ඇති අවදානම් කළමණාකරන පද්ධතියට එරෙහිව බැංකුවේ කාර්යයන් නැවත ඇගයීමක් මීට අයත් වේ. දැනටමත් දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් කිහිපයක් ආරම්භ කර ඇති අතර සේවකයින්ගේ සේවා නියුක්ති තත්ත්වය නොසලකා බැංකුවේ සියළුම සේවකයින්ට මෙම අවස්ථාව ලබා දීමට බලාපොරොත්තු වේ.

## ඉදිරි ගමන

අපගේ සංවර්ධන සැලසුම් සමඟ තවදුරටත් ශ්‍රී ලාංකීය මූල්‍ය වපසරිය තුළ ශක්තිමත් සහ වැදගත් තරඟකරුවකු ලෙස රැඳීසිටීමේ හැකියාව අප සතු වේ. කෙසේ වෙතත් රටෙහි එකිනෙකට වෙනස් නිවාස පහසුකම් සපයන නියෝජිතයින්ට දායකත්වය සැපයීම සඳහා අවස්ථාවන් හඳුනාගනිමින් සංවර්ධනය කළ ජාතික නිවාස ප්‍රතිපත්තියක් ඇතිනම් රටට අපගේ දායකත්වය සැලකිය යුතු අන්දමින් වර්ධනය කර ගත හැකිය. මෙවැනි ප්‍රතිපත්ති රාමුවක් තුළින් වඩාත් ඵලදායී නිවාස සංවර්ධනයක් හා නාගරීකරණයක් සඳහා විවිධ රාජ්‍ය නියෝජිත ආයතන වල විශේෂඥතාවය සන්නද්ධ කළ හැකිය. HDFC බැංකුවටද ඕනෑම කෙනෙකුට දැරිය හැකි පරීක්ෂා කරන ලද නිවාස අකෘතියන් තුළින් දායක විය හැකිය.

අවසාන කිරීමට පළමුව, පසුගිය වර්ෂ 03 තිස්සේ මෙම බැංකුවට අපරිමිත දායකත්වයක් ලබාදුන් හිටපු සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී මාමදුව මහතාට මාගේ ස්තූතිය පුද කරමි. මාමදුව මහතා 2013 වර්ෂයේ සිට බැංකුවේ විවිධාංගීකරණ ක්‍රියාවලිය හා පුළුල් වගකීම් ගණනාවක් ආමන්ත්‍රණය කරන නව නිෂ්පාදිත පෙලක් සංවර්ධනය කිරීම ඉතා සූක්ෂමව හා සාර්ථකව සිදු කරන ලදී. එසේම නව සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී හෙට්ටිආරච්චි මහතා ඉතා ගෞරවයෙන් පිළිගන්නා අතර ඔහුගේ ආර්ථික, මූල්‍ය හා බැංකුකරණ දැනුම මෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශිය කාර්යාල භාර ප්‍රධානියා ලෙස ලැබූ අත්දැකීම් තුළින් ඉදිරි වර්ෂ කිහිපය සඳහා සැලසුම් කළ වර්ධනය ළඟා කර ගැනීම සඳහා ඉහල දායකත්වයක් ලබා ගත හැකි බවට මා විශ්වාස කරමි. එසේම ජාතික වත්කමක් ලෙස බැංකුව ගොඩනැඟීම සඳහා දායක වූ අධ්‍යක්ෂ මණ්ඩලයට, කළමණාකරණයට හා සේවකයින්ටද මාගේ ප්‍රණාමය පුද කරමි.

HDFC බැංකුව අයිති ජනතාවට බවත් අධ්‍යක්ෂ මණ්ඩලයට හෝ සභාපතිතුමාට හෝ සේවක වෘත්තීය සමිති වලට නොවන බවත් අවසාන වශයෙන් ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි. එසේම මහජනතාව හෝ කොටස් හිමියන් නොමැතිව මෙම බැංකුවට ඉදිරි ගමනක් නොමැති අතර HDFC බැංකුව විශ්වාසනීය, නීතිගරුක, මනාව පාලනය වන මෙන්ම තාක්ෂණයෙන් පරිපූර්ණ ඒකකයක් විය යුතුය. ඒවා අප ඉදිරිය කරා යන ගමනේ මාර්ගෝපදේශකත්ව මූලධර්ම විය යුතුය.

විශ්වාසී

**ආර්. ජේ. ද සිල්වා**

*සභාපති*



# සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ සමාලෝචනය

නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ නව සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරිවරයා ලෙස මාගේ පළමු සමාලෝචනය ඉදිරිපත් කිරීමට ලැබීම ගැන මා සතුටට පත්වෙමි. රටෙහි නිවාස මූල්‍ය සඳහා කැපවුන දැවැන්ත අතීතයක් ඇති මෙම පුමුඛ පෙලේ විශේෂිත බැංකුවේ නායකත්වය ලබාදීමට මා කෙරෙහි තැබූ විශ්වාසය සම්බන්ධයෙන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට හා ශ්‍රී ලංකා මහ බැංකුවට මාගේ ප්‍රණාමය පුද කිරීමට කැමැත්තෙමි. මා සතු මූල්‍ය හා බැංකුකරණ දැනුම යොදාගෙන රටෙහි වෙනස්වන මූල්‍ය අවශ්‍යතා වලට ගැලපෙන ලෙස බැංකුව තවදුරටත් ශක්තිමත් කිරීමටත් දක්ෂතා හා ධාරිතාවයන් සමඟ විවිධාංගීකරණය වූ බැංකු ඒකකයක් ලෙස බැංකුවේ තත්ත්වය ගොඩනැංවීමටත් බලාපොරොත්තු වෙමි.

## 2015 වර්ෂයේ කාර්යසාධනය

2015 වර්ෂයේ ෆිච් රේටිංග් වෙතින් ජාතික දිගුකාලීන BBB (lka) ස්ථාවර ශ්‍රේණියකින් බැංකුව පිදුම්ලද අතර 2014 වර්ෂයේ සිට මෙම වර්ෂය අග දක්වා ශක්තිමත් මූල්‍ය කාර්යසාධනයෙහි වර්ධනීය ස්වරූපය රඳවා ගැනීමට හැකිවී ඇත. මෙම තත්ත්වයට ලඟා වූයේ අපේක්ෂා කළ ණය ඉල්ලුමට වඩා අඩු ඉල්ලුමක් පැවති, විදේශ ව්‍යවහාර මුදල් සහ පොළී අනුපාත ඉහළ යන අහිතකර බාහිර පරිසර සාධක හමුවේ බව සඳහන් කළ යුතුය. සියළුම නිෂ්පාදිත වල වර්ධනය තුළින් බැංකුව රු. මිලියන 493 ක බදු පසු ලාභයක්ද රු. මිලියන 4,909 ක ආදායමක්ද වාර්තා කරන ලදී. ණය කළඹෙහි වර්ධනය තුළින් ප්‍රධාන ආදායම් මූලාශ්‍රය වන ණය සහ අත්තිකාරම් ප්‍රමාණාත්මක ලෙස ඉහළ යන ලදී.

**"අපගේ දැනට සිටින සහ නව පාරිභෝගිකයින්ට ගැලපෙන ලෙස සැකසූ නිෂ්පාදිත සහ අන්තර් අලෙවි පරිපූරක නිෂ්පාදිත තුළින් අපගේ නව නිෂ්පාදිත කොටස පුළුල් කිරීම නව මූල්‍ය වර්ෂයේ බැංකුවේ ඉලක්කය වනු ඇත"**

මූලික වශයෙන් ණය සහ අත්තිකාරම් වල වර්ධනය හේතුවෙන් බැංකුවේ වත්කම් වර්ෂයෙන් වර්ෂය රු. මිලියන 41.913 දක්වා 22% කින් ඉහළ යන ලදී. 2015 වර්ෂය අවසාන වන විට බැංකුවේ ණය කළඹ රු. මිලියන 27,316 දක්වා වර්ෂයෙන් වර්ෂය 14% කින් වර්ධනය වී ඇත. මුළු ණය වලින් 89% ක් වූ නිවාස ණය, සමස්ථ ණය කළඹෙහි ප්‍රමුඛම කොටස්කරු විය. සේවක අර්ථසාධක අරමුදලෙහි සාමාජිකයින්ට ඔවුන්ගේ අර්ථසාධක අරමුදල් ශේෂය මත නිවාස ණය සැපයීමට අධිකාරියක් බැංකුව සතු විය. මෙම අර්ථසාධක ණය ප්‍රමාණය නිවාස ණය කළඹ තුළ සැලකිය යුතු ප්‍රතිශතයකට හිමිකම් කියන ලදී. 2015 වර්ෂයේ අපගේ කාර්යසාධනය පිළිබඳ වැඩිදුර තොරතුරු දැනගැනීමට ආංශික කාර්යසාධන සහ මූල්‍ය සමාලෝචන පරිච්ඡේදය පරිශිලනය කරන්න.

2013 වර්ෂයේදී හඳුන්වා දුන් බොහෝමයක් නව නිෂ්පාදිත ඒවායේ අනාගත වර්ධනීය හැකියාවන් මනාව ඔප්පු කරමින් 2015 වර්ෂය තුළදී ප්‍රතිඵල උත්පාදනය කර ඇති බව මා ඉතා සතුටින් ප්‍රකාශ කරමි. බැංකුවේ ඉහළ දමන ලද ප්‍රවර්ධන ධාරිතාවයේ බලපෑම නව මූල්‍ය වර්ෂයට බලපානු ඇතැයිද මා විශ්වාස කරමි.

වර්ෂය අග භාගයේදී ණය සැපයීම වේගවත් කළ අතර රු. බිලියන 04 ක ණයකර නිකුතුව මගින් බැංකුවේ අරමුදල් සැපයීමේ පදනම සැලකිය යුතු ලෙස ශක්තිමත් කරන ලදී. කෙසේ වෙතත් ඉතුරුම් සහ ස්ථාවර තැන්පතු ලෙස ලබාගන්නා මහජන තැන්පතු වර්ෂය තුළ අරමුදල් සැපයීමේ වඩාත් පිරිවැය ඵලදායී මූලාශ්‍රය ලෙස තවදුරටත් පැවතින.

## අභියෝග

අපගේ ප්‍රධාන පාරිභෝගික පදනම මධ්‍ය හා අඩු ආදායම් ලබන ජනතාව හෙයින් බැංකුවේ දළ අක්‍රීය ණය අනුපාතය 20.77% ලෙස තවදුරටත් පැවතිනි. බොහෝමයක් ගැටළු සේවක අර්ථසාධක අරමුදල් මත වූ නිවාස ණය වල නොගෙවීම් වලින් මඟ හැරුනි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මාස 03 කට වැඩි හිඟ සේවක අර්ථසාධක අර්ථසාධක අරමුදල මත පදනම් වූ ණය වාරික වාර්ෂිකව ප්‍රතිපූර්ණය කරන ලදී. එසේ වුවද නොපියවෙන විශාල අක්‍රීය ණය අනුපාතය වෙනුවට හිඟ වාරික සහ උපචිත පියවීම් හේතුවෙන් ගිණුම්කරණ පරතරයක් නිර්මානය විය. බැංකුවට මුහුණ දීමට

# සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ සමාලෝචනය

සිදුවූ තවත් අභියෝගයක් වූයේ ප්‍රතිපත්තිමය පොළී අනුපාත වල ඉහළ යාමේ ප්‍රවනතාවයයි. මෙම තත්ත්වයට ඉතා ඉක්මණින් බැංකුව ක්‍රියාත්මක වීම නිසා ස්ථායීභාවය රැකගැනීමට බැංකුවට හැකිවනු ඇතැයි මා විශ්වාස කරමි. 2015 වර්ෂයේදී බැංකුව සිදුකළ ණයකර නිකුතුව මගින් බැංකුවේ පැවති පරිණතකාල නොගැලපීම් වලට විශාල ලෙස ධනාත්මක අයුරින් ප්‍රතික්‍රියා දක්වන ලදී. තවත් හිතකර තත්ත්වයක් වූයේ ණයකර නිකුතුවෙන් රැස්කරගත් අරමුදල් වලින් බැංකුවේ 2015 වර්ෂයේ ශේෂ පත්‍රය වඩා ශක්තිමත් කිරීමයි.

රු. බිලියන 05 ක් වන අවම ව්‍යවස්ථාපිත ප්‍රාග්ධනයෙන් රු. බිලියන 03 ක ප්‍රාග්ධනය සපයා ගැනීම තුළ අපගේ අතුරු ඉලක්ක කරා ලඟා වී ඇත. ඉතිරිය සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව 2017 තෙක් කල් ලබා දී ඇති අතර ප්‍රාග්ධන වර්ධන සැලසුම සැකසෙමින් පවතී.

## ධාරිතාවය ගොඩනැගීම

බැංකුව ඉලක්ක කරන අකාරයට විවිධාංගීකරණය තුළින් වර්ධනය වීම සඳහා දක්ෂතා මට්ටමින් හා පද්ධති වශයෙන් ඊට ගැලපෙන ආකාරයට අභ්‍යන්තර ධාරිතාවයන් පුළුල් කිරීම අත්‍යවශ්‍ය වේ. පවත්නා මූල්‍ය වර්ෂය තුළදී නව බැංකුකරණ පද්ධතියක් සඳහා සහ අපගේ මානව සම්පත් පදනම සංවර්ධනය සඳහා ආයෝජනය කර එම කටයුතු ආරම්භ කරන ලදී. බැංකුවේ අපේක්ෂිත වර්ධන තත්ත්වයන්ට පහසුකම් සැපයීම සඳහා නවීන බැංකුකරණ පද්ධතියකට විතැන් වීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. මෙම ක්‍රියාමාර්ගය සමඟ බැංකුවට නව තාක්ෂණය පදනම් වූ නිෂ්පාදිත හඳුන්වාදීමේ ධාරිතාවය ගොඩනැගෙනු ඇත. 2015 වර්ෂය තුළදී නව බැංකුකරණ පද්ධතියට අදාළ මෘදුකාංග සංවර්ධනය හා දෘඩාංග අත්පත්කරගැනීම් බොහොමයක් සිදුකර ඇති අතර 2016 වර්ෂයේ අගෝස්තු මාසය වන විට නව පද්ධතිය වාණිජ මෙහෙයුම් වලට යොදාග ැනීමට අප බලාපොරොත්තු වේ. බැංකුව විසින් රු. මිලියන 200 ක් පමණ යොදවා සිදුකරන මෙම තාක්ෂණික උසස් කිරීම තුළින් වර්තමානයේ පවතින පද්ධතියට සාපේක්ෂව ඉතා ඉහළ තාක්ෂණයකින් යුක්ත අතිනවීන පද්ධතියක් ස්ථාපිත වනු ඇත. මෙම නව පද්ධතිය තුළින් තීරණ ගැනීම සඳහා නිවැරැදි තොරතුරු වේගවත්ව ලබාදීම, ප්‍රධාන කාර්යාලයේ සහ ශාඛා වල කටයුතු වඩාත් හොඳින් නිරීක්ෂණය කිරීම, ඉක්මණින් ප්‍රතික්‍රියා දැක්වීම, නම්‍යශීලීත්වය සහ නිෂ්පාදිත හා සේවා වල ප්‍රමිතීන් උසස් කල හැකි වීම වැනි ප්‍රතිලාභ මෙන්ම කළමණාකරන තොරතුරු පද්ධතියක සේවාවන්ද ඉටු කරගත හැකිය. මෙම තාක්ෂණික උසස් කිරීමේ කොටසක් ලෙස පවතින Palmtop තාක්ෂණයද ඇන්රොයිඩ් පද්ධතියට අනුගත කර උසස් කරනු ලැබේ.

බැංකුව ප්‍රතිලාභ වලින් සවි බලගැන්වීමට නම් එම තාක්ෂණික උසස් වීම් මානව සම්පත් ධාරිතා සංවර්ධනයට සමගාමීව සිදුකළ යුතුය. බැංකුව තුල දීර්ඝ කාලයක් සේවයේ නියුතු සේවක පදනම සහ නිවාස වෙළෙඳපොළ පිළිබඳ ඔවුන් සතු දැනුම බැංකුවට විශාල ශක්තියක් වන අතර නවීන බැංකුකරණ දැනුම ලබාදීම තුළ ඔවුන්ව තවදුරටත් සංවර්ධනය කල හැකි බව මාගේ විශ්වාසයයි. අප දැනටමත් අවශ්‍යතා හඳුනාගැනීමේ පුහුණුවක් ආරම්භ කර ඇති අතර මෙම වෙනස් කම් සඳහා උපකාර වන දේශීය හා විදේශීය පුහුණු මධ්‍යස්ථාන හඳුනාගැනීමක් මානව සම්පත් අංශය මඟින් සිදුකරමින් පවතී.

2015 වර්ෂය තුළදී නව ශාඛා දෙකක් ආරම්භ කළ අතර දැනට පවතින ශාඛා උසස් කිරීම සඳහා අවධානය යොමු කර ඇත. එසේම ජංගම බැංකු ඒකක සමඟ බැංකුව ග්‍රාමීය ප්‍රදේශ වලට ඇතුලත් වනු ඇත.

## අනාගත සැලසුම්

අපගේ දැනට සිටින සහ නව පාරිභෝගිකයින්ට ගැලපෙන ලෙස සැකසූ නිෂ්පාදිත සහ අන්තර් අලෙවි පරිපූරක නිෂ්පාදිත තුළින් අපගේ නව නිෂ්පාදිත කොටස පුළුල් කිරීම නව මූල්‍ය වර්ෂයේ බැංකුවේ ඉලක්කය වනු ඇත. මෙම ක්‍රියාවලියට Palmtop බැංකුකරුවන් වෙත ලඟාවීම පුළුල් කිරීම තුළින්ද සහයෝගය ලැබේ. බැංකුවේ ණය අවදානම පාලනය කිරීම සඳහා අක්‍රීය ණය අනුපාතය පහළ දැමීමට සහ අඩු මට්ටමක පවත්වා ගැනීමට අවධානය යොමු කර ඇත. නම්‍යශීලී වාර්තාකරණ ව්‍යුහයකට පහසුකම් සපයන නව තොරතුරු තාක්ෂණ පද්ධතිය සමඟ නියාමන අනුකූලතාවය, අවදානම් කළමණාකරනය සහ ව්‍යාපාර කළමණාකරනය, අලෙවිකරණය සහ මානව සම්පත් කළමණාකරනය යන අංශ 03 කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් බැංකුවේ සංවිධාන ව්‍යුහය නැවත සකස්කිරීම පිළිබඳවද අප සලකා බලමින් සිටී.

## ඇගයීම

වෙනස්කම් තුළ වැදගත්ම පසුගිය වර්ෂය තුළ බැංකුවේ කටයුතු මෙහෙය වූ හිටපු සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී මාමදුව මහතාට මාගේ ස්තුතිය පුදකරන අතර බැංකුවේ සාර්ථකත්වය වෙනුවෙන් විශිෂ්ඨ කාර්යසාධනයක් පෙන්නුම් කළ

කළමණාකරණයට සහ සේවක මණ්ඩලයට ද මාගේ ප්‍රණාමය පුද කරමි. එසේම ලබාදුන් සහයෝගය වෙනුවෙන් රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාටද ශ්‍රී ලංකා මහ බැංකු අධිපති තුමාට සහ එහි  බැංකු සුපරීක්ෂණ අංශයටද මාගේ ස්තූතිය පුද කරමි. එසේම වර්ෂය පුරා අපව විශ්වාස කොට දැක්වූ පක්ෂපාතීත්වය වෙනුවෙන් අපගේ සියළුම පාර්ශවකරුවන්ට  හෘදයාංගම ස්තූතිය පුද කරන අතර නව මූල්‍ය වර්ෂයේදී අපගේ විශිෂ්ඨ සේවය ඔවුනට ලබාදෙන බවට සහතික වෙමි.

විශ්වාසී



**ආර් හෙට්ටිආරච්චි**

*සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී*

**2013 වර්ෂයේදී හඳුන්වා දුන් බොහෝමයක් නව නිෂ්පාදිත ඒවායේ අනාගත වර්ධනීය හැකියාවන් මනාව ඔප්පු කරමින් 2015 වර්ෂය තුළදී ප්‍රතිඵල උත්පාදනය කර ඇති බව මා ඉතා සතුටින් ප්‍රකාශ කරමි. බැංකුවේ ඉහළ දමන ලද ප්‍රවර්ධන ධාරිතාවයේ බලපෑම නව මූල්‍ය වර්ෂයට බලපානු ඇතැයිද මා විශ්වාස කරමි.**

# අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

## 01. සාමාන්‍ය

HDFC බැංකුව 1997 අංක 07 දරණ නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත (2003 අංක 15 සහ 2011 අංක 45 දරණ සංශෝධන පනත්) යටතේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාපනය කරන ලද ලැයිස්තුගත කළ බලපත්‍රලාභී විශේෂිත බැංකුවකි.

**මෙම වාර්තාවේ නිරවද්‍යතාවය**

2007 අංක 07 දරන සමාගම් පනතේ සහ 1988 අංක 30 දරන බැංකු පනතේ අවශ්‍යතාවයන් ඉෂ්ඨ කරමින් බැංකුවේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ එම මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාව සමඟ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය කොටස් හිමියන්ට ඉදිරිපත් කරමු. 2016 මැයි මස 16 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කර අනුමත කරන ලදී.

2007 අංක 07 දරන සමාගම් පනතෙහි, 2007 අංක 11 දරන බැංකු පනත් නියෝගයෙහි (බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා සාංගමික යහපාලනය සහ පසුකාලීන සංශෝධන) සහ කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ නීතිරීති වල අවශ්‍යතාවයන්ට සරිලන තොරතුරු වලින් මෙම වාර්තාව සමන්විත වේ.

මූල්‍ය සේවා අංශයේ ලැයිස්තුගත සමාගම් සඳහා වූ නියාමන අධිකාරී වල අවශ්‍යතා හා ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලටත්, කොටස් හිමියන්ගේ හා අනෙකුත් පාර්ශවකරුවන්ගේ අවධානයට යොමුවන මනා ගිණුම්කරන පරිචයන්ට අනුකූලව මෙම වාර්තා වල අන්තර්ගතය හා නිමාව සැකසී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වැදගත් යැයි සැලකූ හා බැංකුවට සහ කොටස් හිමියන්ට හිතකර තොරතුරු අනාවරණය කර ඇත.

## 02. මූලික ක්‍රියාකාරකම්

නිවාස සහ නිවාස සංවර්ධන කටයුතු සඳහා මූල්‍ය පහසුකම් සැපයීම බැංකුවේ මූලික ව්‍යාපාර ක්‍රියාකාරකම් වේ. ඊට අමතරව වර්ෂය තුළදී උකස්කරණ මූල්‍ය, කල්බදුකරණ හා කුලිපිට ගැණුම් සේවා, රන් උකස් තැරැව්කරන සේවා, ජංගම බැංකුකරණ හා ක්ෂුද්‍ර මූල්‍ය ආදී බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා අනුමත කරන ලද සාමාන්‍ය බැංකු සේවාවලද නියලෙන ලදී. සලකා බලන මූල්‍ය වර්ෂය තුළදී බැංකුවේ මූලික ව්‍යාපාර ක්‍රියාකාරකම් වල ස්වභාවයෙහි සැලකිය යුතු වෙනසක් සිදුවී නැත. වර්ෂය තුළ බැංකුවේ කටයුතු පිළිබඳ වැඩිදුර විස්තර දැනගැනීමට ආංශික කාර්යසාධන කොටස පරිශීලනය කරන්න.

## 03. ව්‍යාපාර සමාලෝචනය

අදාළ වර්ෂය තුළ මූල්‍ය තත්ත්වය, කාර්යසාධනය, සබඳතා වල තත්ත්වය හා සිදුවූ වැදගත් සිදුවීම් පිළිබඳ සමස්ථ සමාලෝචනයක් සභාපතිතුමන්ගේ සමාලෝචනය තුළ හා සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීතුමන්ගේ සමාලෝචනය තුළ ඇතුලත් වේ. මෙම වාර්තා අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාවේ අන්තර්ගත කොටසක් වේ.

2015 මූල්‍ය වර්ෂය තුළ බැංකු වේ මෙහෙයුම් හා එම මෙහෙයුම්වල ප්‍රතිඵල පිළිබඳ ආංශික කාර්යසාධන කොටස තුළ සහ අපගේ ප්‍රාග්ධනයන් කළමණාකරනය කිරීම මාතෘකාව යටතේ සමාලෝචනයක් සිදුකර ඇත. මෙම වාර්තා අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාවේ අන්තර්ගත කොටසක් වේ.

## 04. දැක්ම, මෙහෙවර හා සාංගමික පැවැත්ම

බැංකුවේ දැක්ම හා මෙහෙවර ප්‍රකාශය වාර්ෂික වාර්තාවේ දක්වා ඇත. බැංකුවේ දැක්ම හා මෙහෙවර වෙත ළඟාවීම සඳහා උසස් තත්ත්වයේ ආචාර ධර්ම ප්‍රමිතීන්ට අනුකූලව බැංකුව ව්‍යාපාර කටයුතු මෙහෙයවන ලදී. බැංකුව සෑම විටම සාංගමික යහපාලනය වෙත හඹා යන අතර මූලය සහ මෙහෙයුම් කටයුතු වලදී ඉහල ප්‍රමිතීන් පවත්වා ගනී.

## 05. අනාගත සංවර්ධනයන්

බැංකුවේ අනාගත උපායන් එහි සංස්ථාපිත පනතට (සහ සංශෝධන) අනුව සිදුකරන අතර සභාපතිතුමන් විසින් සභාපතිතුමන්ගේ පණිවිඩය තුළ එය පැහැදිලි කර ඇත.

## 06. මූල්‍ය ප්‍රකාශන

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කළ ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතීන්ට සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ සහ 1988 අංක 30 දරන බැංකු පනතේ අවශ්‍යතා වලට අනුකූලව පිළියෙල කර ඇත. 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාවේ වැදගත් කොටසක් වේ.

## 07. වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති

වර්ෂය තුළ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී යොදාගත් වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති වාර්ෂික වාර්තාවෙහි ඇතුලත් වේ. ස්කන්ධය වෙනස්වීම සඳහා බලපෑම වාර්ෂික වාර්තාවෙහි ඇතුලත් වේ

## 08. විගණකවරුන්ගේ වාර්තාව

ආදාළ මූල්‍ය වර්ෂය සඳහා HDFC බැංකුවේ මූල්‍ය ප්‍රකාශන මත විගණනය HDFC බැංකුවේ විගණක වන විගණකාධිපති විසින් සිදුකරන ලද අතර අදාළ විගණන වාර්තාව වාර්ෂික වාර්තාවෙහි හි ඇතුලත් වේ.

## 09. අඛණ්ඩ පැවැත්ම

පුරෝකථනය කල හැකි අනාගතයක් සඳහා ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට HDFC බැංකුව සතුව සම්පත් පවතින බවට අධ්‍යක්ෂ මණ්ඩලය සමාලෝචනය කර සෑහීමකට පත්වී සිටී. එම නිසා ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පදනමට අනුව එය සිදුකරනු ලැබේ.

### 10. ආදායම

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ ආදායම රු. මිලියන 4,909 කි. ආදායම පිළිබඳ විශ්ලේෂණයක් මූල්‍ය ප්‍රකාශන වල සටහන් 1 සහ 3 හි දැක්වේ.

### 11. ලාභ සහ විසර්ජනයන්

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ බදු පෙර ලාභය රු මිලියන 787 සහ බදු පසු ලාභය රු මිලියන 493 වේ.

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2015 රු. මිලියන | 2014 රු. මිලියන |
|---|---:|---:|
| මූල්‍ය සේවා මත අගය මත එකතු කළ බද්ද (VAT) | 175 | 142 |
| බදු සඳහා ප්‍රතිපාදන | 294 | 260 |
| බදු පසු මූලික කටයුතු වලින් ලද ලාභය | 493 | 375 |
| ඉදිරියට ගෙන ගිය රඳවාගත් ලාභය/(සමුච්චිත අලාභය) | 1,551 | 1,296 |
| විසර්ජනය සඳහා පවතින ලාභය | 2,096 | 1,671 |
| යෝජිත පළමු සහ අවසාන ලාභාංශ සඳහා වෙන්කිරීම | 49 | 39 |
| සංචිත අරමුදලට මාරු කිරීම | 74 | 56 |
| ඉදිරියට ගෙන ගිය රඳවාගත් ලාභය | 2,097 | 1,551 |

### 12. සංචිත

2015 දෙසැම්බර් 31 දිනට බැංකුව සතු සංචිත රු මිලියන 2,402 කි. ඊට අදාළ තොරතුරු මූල්‍ය ප්‍රකාශන වල වූ ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය තුල දැක්වේ.

### 13. පරිත්‍යාග

බැංකුව විසින් වර්ෂය තුළ  පරිත්‍යාග සිදුකර නැත.

### 14. ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ දැනුමට හා විශ්වාසයට අනුව රජයට හා සේවකයින්ට අදාළ ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත දිනට ගෙවා ඇති බවට සෑහීමට පත්වෙයි.

### 15. බදුකරණය සඳහා ප්‍රතිපාදන

බැංකුවේ මෙහෙයුම් කටයුතු වලින් ජනිත වූ බද්දට යටත් ආදායම මත 28% 2015 වර්ෂයේ ආදායම් බදු සඳහා සම්පාදනය කරන ලදී. එය වාර්ෂික වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 10 හි අනාවරණය කර ඇත.

### 16. ලාභාංශ

2015 වර්ෂය සඳහා මුළු සහ අවසාන ලාභාංශය ලෙස කොටසකට ශත 75 ක ලාභාංශයක් අධ්‍යක්ෂවරු නිර්දේශ කරන ලදී. එය නුබුන්වත්භාවය පිළිබඳ පරීක්ෂණයට හා HDFC බැංකුවේ මහා සභා රැස්වීමේදී කොටස් හිමියන්ගේ අනුමැතියට යටත් වේ. බැංකුවේ මහා සභා රැස්වීමේදී කොටස් හිමියන්ගේ අනුමැතිය සමඟ යෝජිත ලාභාංශය ගෙවූ විගස 2007 අංක 07 දරන සමාගම් පනතය අනුව බැංකුවට නුබුන්වත්භාවය පිළිබඳ පරීක්ෂණයට ලඟා විය හැකි බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමට පත්වෙයි. අවසාන ලාභාංශය ගෙවීම අනුමත කිරීමට අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය නුබුන්වත්භාවය පිළිබඳ ප්‍රකාශනය විගණකාධිපති වෙත යොමු කර නුබුන්වත්භාවය පිළිබඳ සහතිකය ලබාගෙන ඇත.

### 17. දේපළ ,පිරියත හා උපකරණ, සින්නක්කර දේපළ

දේපළ, පිරියත හා උපකරණ මත ප්‍රාග්ධන වියදම් රු මිලියන 216 ක් වන අතර ඒ පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 18 හි දක්වා ඇත.

සින්නක්කර දේපළ පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 18 හි දක්වා ඇත.

### 18. සින්නක්කර දේපළ වල වෙළෙඳපොළ අගය

සින්නක්කර දේපළ වල වෙළෙඳපොළ අගය පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 18.2 සහ 18.3 හි දක්වා ඇත.

### 19. මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනට පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශන තුළ ගැලපිය යුතු හෝ අනාවරණය කළ යුතු මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනට පසු සිදු වූ ප්‍රමාණාත්මක සිදුවීම් කිසිවක් නොමැත.

### 20. ප්‍රකාශිත ප්‍රාග්ධනය

2015 දෙසැම්බර් 31 දිනට සාමාන්‍ය කොටස් 64,710,520 කින් සමන්විත බැංකුවේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. මිලියන 962 කි.

### 21. කොටස් පිළිබඳ තොරතුරු

කොටස් පිළිබඳ තොරතුරු (කොටසකට අදාළ ඉපයුම, ලාභාංශ, ශුද්ධ වත්කම් සහ වෙළෙඳපොළ වටිනාකම) වාර්ෂික වාර්තාවේ දැක්වේ.

## අධ්‍යක්‍ෂවරුන්ගේ වාර්තාව

### 22. ණයකර

බැංකුව 2013 වර්ෂයේදී මුහුණත අගය රු. මිලියන 2000 ක ලැයිස්තුගත කළ නිදහස් කල හැකි ආරක්ෂිත ණයකර නිකුත් කල අතර මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනට නොගෙවූ ණයකර පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශන වල සටහන් 24 හි සඳහන් වේ.

තවදුරටත් බැංකුව 2015 වර්ෂයේදී මුහුණත අගය රු. මිලියන 4000 ක ලැයිස්තුගත කළ නිදහස් කල හැකි අනාරක්ෂිත ණයකර නිකුත් කල අතර මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනට නොගෙවූ ණයකර පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශන වල සටහන් 24 හි සඳහන් වේ. බැංකුව මෙම ණයකර කොළඹ කොටස් වෙළෙඳපොලෙහි ප්‍රධාන පුවරුවෙහි ලැයිස්තුගත කර ඇත.

### 23. සියළුම පාර්ශවකරුවන්ට සමානාත්මතාවයෙන් සැලකීම

පාර්ශවකරුවනට නිකුත් කළ මුල් වගන්ති වලට අනුකූලව සියළුම පාර්ශවකරුවන්ට සමානාත්මතාවයෙන් සලකා ඇත. විස්තර සඳහා “අපගේ පාර්ශවකරුවන් සමඟ සම්බන්ධ වීම” යන පරිච්ඡේදය පරිශීලනය කරන්න.

### 24. අධ්‍යක්‍ෂ මණ්ඩලය

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ සම්පූර්ණ ලැයිස්තුව සහ ඔවුන්ගේ සුදුසුකම් සහ අත්දැකීම් සඳහා අධ්‍යක්‍ෂ මණ්ඩලය යන පරිච්ඡේදය පරිශීලනය කරන්න.

**සලකා බලන කාලච්ඡේදය තුළ** HDFC **බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලයෙන් ඉවත් වීම්.**

1. ඩී. එච්. යූ. ජේ. කුරුකුලරත්න මහතා - 2015 ජූනි මස 06 සිට බලපැවැත්වෙන පරිදි
2. හේරත් යාපා මහතා - 2015 සැප්තැම්බර් මස 18 සිට බලපැවැත්වෙන පරිදි
3. එල්. ඊ. සුසන්ත සිල්වා මහතා -2015 මැයි මස 31 සිට බලපැවැත්වෙන පරිදි
4. එස්. එන්. වික්‍රමසිංහ මහත්මිය - 2015 ජනවාරි මස 21 සිට බලපැවැත්වෙන පරිදි
5. එස්. ඒ. ජේ. සමරවිර මහතා - 2015 ජනවාරි මස 21 සිට බලපැවැත්වෙන පරිදි
6. ඩබ්ලිව්. ඩී. ආර්. ඩී. ගුණරත්න මහතා - 2015 ජනවාරි මස 21 සිට බලපැවැත්වෙන පරිදි
7. එම්. එෆ්. කේ. නීසා මහත්මිය - 2015 ජනවාරි මස 21 සිට බලපැවැත්වෙන පරිදි
8. ඩබ්ලිව්. ජේ. එල්. යූ. විජයවීර මහතා - 2015 ජනවාරි මස 21 සිට බලපැවැත්වෙන පරිදි
9. බී. ජී. එස්. ගුණතිලක මහත්මිය - 2015 ජනවාරි මස 21 සිට බලපැවැත්වෙන පරිදි

**සලකා බලන කාලච්ඡේදය තුළ** HDFC **බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලයෙන් පත්වීම්.**

1. ආර්. ජේ. ද සිල්වා මහතා - 2015 පෙබරවාරි මස 11 සිට බලපැවැත්වෙන පරිදි
2. බී. ජී. එස්. ගුණතිලක මහත්මිය - 2015 පෙබරවාරි මස 20 සිට බලපැවැත්වෙන පරිදි
3. ආර්. එම්. ජේ. රත්නායක මහතා - 2015 මාර්තු මස 02 සිට බලපැවැත්වෙන පරිදි
4. ආර්. එච්. මීවක්කල මහතා - 2015 ජූනි මස 03 සිට බලපැවැත්වෙන පරිදි
5. එල්. එස්. පලන්සූරිය මහතා - 2015 ජූනි මස 26 සිට බලපැවැත්වෙන පරිදි
6. ජී. එස්. පුංචිහේවා මහතා - 2015 ජූනි මස 26 සිට බලපැවැත්වෙන පරිදි
7. එස්. එම්. ජේ. ජයරත්න මහතා - 2016 පෙබරවාරි මස 17 සිට බලපැවැත්වෙන පරිදි

### 25. අධ්‍යක්‍ෂ මණ්ඩල උප කමිටු

බැංකුවේ පාලනය සහ කළමණාකරනය සඳහා සමස්ථ වගකීම හා වගවීම අධ්‍යක්‍ෂ මණ්ඩලය දරන අතර ශ්‍රී ලංකා මහ බැංකුවේ, වරලත් ගණකාධිකාරී ආයතනයේ හා කොළඹ කොටස් වෙළෙඳපොලෙහි සාංගමික යහපාලන නියමයන්ගේ අවශ්‍යතාවය අනුව අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් විවිධ ක්ෂේත්‍ර සඳහා අධ්‍යක්‍ෂ මණ්ඩල උප කමිටු පත්කර ඇත.
ඉහත අධ්‍යක්‍ෂ මණ්ඩල උප කමිටු වල කාර්යයන්, වගකීම් සහ කාර්යසාධනය වාර්ෂික වාර්තාවේ දක්වා ඇත.

### 26. අධ්‍යක්‍ෂවරුන්ගේ රැස්වීම්

අධ්‍යක්‍ෂ මණ්ඩල හා අධ්‍යක්‍ෂ මණ්ඩල උප කමිටු වල පැමිණීමේ වාර්තාව පරිශීලනය කරන්න.

### 27. මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්‍ෂවරුන්ගේ වගකීම

HDFC බැංකුවේ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස නිරූපනය වන ආකාරයෙන් බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා අධ්‍යක්‍ෂවරු වගකීම දරනු ලැබේ. අධ්‍යක්‍ෂවරුන්ගේ වාර්ෂික වාර්තාවේ අන්තර්ගත කොටසක් වන මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්‍ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශනයෙහි දැක්වේ.

### 28. බැඳීම පිළිබඳ ලේඛනයෙහි ඇතුලත් කිරීම්.

2007 අංක 07 දරන සමාගම් පනතෙහි වගන්ති වල අවශ්‍යතාවය මත බැංකුව විසින් අධ්‍යක්‍ෂවරුන්ගේ බැඳීම පිළිබඳ ලේඛනයක් පවත්වාගනී. බැංකුවේ අධ්‍යක්‍ෂවරු ඔවුන්ගේ බැඳීම පිළිබඳ අවශ්‍ය ප්‍රකාශයන් ලබාදිය යුතු අතර ඒවා බැඳීම පිළිබඳ ලේඛනයෙහි වාර්තා කර ඇත.

එම අනාවරණයන් වලට අමතරව අධ්‍යක්‍ෂවරුන්ට බැංකුව සමඟ ගිවිසුම්ගත හෝ යෝජිත ගිවිසුමක් මගින් හෝ සෘජු හෝ වක්‍ර බැඳීමක් නොමැත. අධ්‍යක්‍ෂවරුන්ට බැඳීමක් ඇති කිසිදු කරුණක් සම්බන්ධ සාකච්ඡාවකට, අනුමත කිරීමකට හෝ ඡන්දයකට එම අධ්‍යක්‍ෂවරුන් සහභාගී වී නැත.

## 29. අධ්‍යක්ෂවරුන්ගේ කොටස් හිමිකාරීත්වය

අධ්‍යක්ෂවරුන්ගේ කොටස් හිමිකාරීත්වය පහත පරිදි වේ.

| | 31/12/2015 | 01/01/2015 |
|---|---|---|
| ආර්. ජේ ද සිල්වා මහතා( සභාපති) | - | - |
| එම් සුරේන්ද්‍රන් මහතා | 1000 | - |
| ප්‍රසාද් ගල්හේන මහතා | 1000 | 1000 |
| බී. ජී. එස් ගුණතිලක මහත්මිය | - | - |
| ආර්. එම් .ජේ රත්නායක මහතා | - | - |
| ආර්. එච් මීවක්කල මහතා | - | - |
| එල්. එස් පලන්සූරිය මහතා | - | - |
| පී. එස් පුංචිහේවා මහතා | - | - |

## 30. ගිවිසුම් සහ යෝජිත සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ බැඳීම

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා HDFC බැංකුව ඇතිකරගත් ගිවිසුමකට හෝ යෝජිත ගිවිසුමකට ඍජු හෝ වක්‍ර බැඳීමක් අධ්‍යක්ෂවරුන්ට නොමැත. විස්තර වාර්ෂික වාර්තාවේ දැක්වේ.

බැඳීමක් ඇති කිසියම් කරුණක් සම්බන්ධයෙන් ඡන්දයෙන් වැලකීම සහතික වීම සඳහා අධ්‍යක්ෂවරු ඔවුන්ගේ බැඳීම (ඇත්නම්)පිළිබඳ හෙළිදරව් කල යුතුය.

## 31. ණයකර වල අධ්‍යක්ෂවරුන්ගේ බැඳීම

අධ්‍යක්ෂවරුන්ගේ තනි තනි ණයකර හිමිකාරීත්වය පහත දැක්වේ.

| 2015 දෙසැම්බර් 31 දිනට | ණයකර ගණන | වටිනාකම |
|---|---|---|
| ආර්. ජේ ද සිල්වා මහතා( සභාපති) | - | - |
| එම් සුරේන්ද්‍රන් මහතා | - | - |
| ප්‍රසාද් ගල්හේන මහතා | - | - |
| බී. ජී. එස් ගුණතිලක මහත්මිය | - | - |
| ආර්. එම් .ජේ රත්නායක මහතා | - | - |
| ආර්. එච් මීවක්කල මහතා | - | - |
| එල්. එස් පලන්සූරිය මහතා | - | - |
| පී. එස් පුංචිහේවා මහතා | - | - |
| එකතුව | - | - |

## 32. සම්බන්ධිත පාර්ශව ගණුදෙනු

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අදාළ කරගනු ලබන ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත 24 “සම්බන්ධිත පාර්ශව ගණුදෙනු” ට අනුව සම්බන්ධිත පාර්ශව ගණුදෙනු ලෙස වර්ගීකරණය වන ගණුදෙනු ඇත්නම් ඒවාද අධ්‍යක්ෂවරුන් අනාවරණය කර ඇත. අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික වාර්තාවේ වැදගත් කොටසක් වන මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 33 හි අධ්‍යක්ෂවරුන් අනාවරණය කල ගණුදෙනු දක්වා ඇත.

## 33. අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 08 හි දක්වා ඇත.

## 34. පරිසර සංරක්ෂණය

අධ්‍යක්ෂ මණ්ඩලයේ දැනුමට අනුව බැංකුව අදාළ පරිසර නීති සහ නියාමනයන්ට අනුකූල වී ඇත. පරිසරයට හානිදායක කිසිදු ක්‍රියාකාරකමක බැංකුව නියලී නැත.

## 35. අවදානම් කළමණාකරනය සහ අභ්‍යන්තර පාලන පද්ධතිය

බැංකුවේ අවදානම් කළමණාකරණ යනු බැංකුකරණ මෙහෙයුම් කටයුතු නිසා බැංකුවට නිරාවරණය වන අවදානම් හඳුනාග ැනීම, ඇගයීම සහ කළමණාකරනය කිරීම යන කාර්යයන්ගෙන් සමන්විත නිරන්තර ක්‍රියාවලියකි. අවදානම් කළමණාකරන වාර්තාවෙහි මෙම ක්‍රියාවලිය පිළිබඳ විස්තර ඇතුලත් වේ. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමණාකරන කමිටුව මගින් අධ්‍යක්ෂවරු නිරන්තරව එම ක්‍රියාවලිය සමාලෝචනය කරනු ලබයි.

## අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මඟින් බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිය නිතිපතා සමාලෝචනය කරනු ලබයි. බැංකුවේ කටයුතු වඩාත් හොඳින් සිදුකිරීමට බැංකුව සතුව ශක්තිමත් අවදානම් කළමණාකරන සහ අභ්‍යන්තර පාලන පද්ධතියක් පවතින බවට සහතික වෙමින් එම උප කමිටු දෙකම අවශ්‍ය නිර්දේශ සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කරනු ලැබේ.

විගණන කමිටු වාර්තාව සහ අවදානම් කළමණාකරන පරිච්ඡේදය පරිශීලනය කරන්න.

### 36. සාංගමික යහපාලනය

සාංගමික යහපාලනය සම්බන්ධයෙන් සභාපතිවරයාගේ ප්‍රකාශය පරිශීලනය කරන්න. 4,400 (SLSRS) යටතේ විගණකයින් නිකුත් කළ " සත්‍ය සොයගැනීම් වාර්තාවෙහි" සොයා ගැනීම් සමඟ ශ්‍රී ලංකා මහ බැංකුව බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා නිකුත් කළ සාංගමික යහපාලනය නියෝගයේ අවශ්‍යතාවයට අනුව වෙනමම සාංගමික යහපාලනය මත වාර්තාවක් ඇතුලත් කර ඇත.

### 37. අදාළ නීති සහ නියාමනයන්ට අනුකූලතාවය

ලැයිස්තුගත සමාගමක් ලෙස කොළඹ කොටස් වෙළෙඳපොලෙහි ලැයිස්තුගත කිරීමේ නීතිරීති ඇතුලත්ව අදාළ වන්නා වූ සෑම නීතියක් හා නියාමනයක් සඳහාම සෑම අවස්ථාවකම අනුකූල වන බවට සහතික කර ඇත. ඒකාබද්ධ අවදානම් කමිටුවට වගකියන අනුකූලතා නිලධාරී විසින් සකස් කල අනුකූලතා වාර්තාවක් ඒකාබද්ධ අවදානම් කමිටුවේ කාර්තුමය රැස්වීමට ඉදිරිපත් කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අඛණ්ඩව අදාළ නියාමන සහ සුපරීක්ෂණ ආයතන සමඟ තොරතුරු සන්නිවේදනය කරන අතර රටෙහි පවත්නා නීති සහ නියාමනයන්ට අනුව තීරණ ගෙන ඇත. අධ්‍යක්ෂවරුන්ගේ දැනුමට අනුව බැංකුව අනාවරණය කලයුතු කිසිදු ක්ෂේත්‍රයක සෘජු හෝ වක්‍ර නීති හෝ නියාමනයන් උල්ලංඝනය කිරීමක් සිදු කර නැති අතර බැංකුවට ප්‍රමාණාත්මක මූල්‍ය බලපෑමක් ඇති කලහැකි සේවක කළමණාකරනයෙහි කිසිදු අකටයුත්තක් ද සිදු වී නැත.

### 38. විගණකයින් පත්කර ගැනීම

1997 අංක 07 දරණ නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතට අනුව බැංකුවේ විගණක ලෙස විගණකාධිපති කටයුතු කරයි.

### 39. විගණකයිගේ පාරිශ්‍රමික සහ බැංකුව සමඟ ගිවිසුම්ගත බැඳීම

බැංකුව විසින් විගණන ගාස්තු ලෙස 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රු. 685,200/- ක් විගණකයින්ට ගෙවා ඇත. විගණකයින් සමඟ බැංකුවට වෙනත් බැඳීමක් හෝ ගිවිසුම්ගත බැඳීමක් නොමැත.

### 40. විගණන කමිටුව

විගණන කමිටුවේ සංයුතිය සහ ඔවුන්ගේ වාර්තාව වාර්ෂික වාර්තාවෙහි දැක්වේ.

### 41. රැස්වීම් නිවේදනය

බැංකුවේ 31 වෙනි වාර්ෂික මහා සභා රැස්වීම 2016 ජුනි මස 30 දින පෙ.ව 10.00 ට බුකර් රික්‍රියේශන් පුද්ගලික සමාගම, (ගාඩිනියා ශාලාව) පළවන මහල, අංක 10, පිටත ඩීන්ස් පාර, හෙජස් කෝට්, කොළඹ 10 හි පැවැත්වේ. රැස්වීම් නිවේදනය වාර්ෂික වාර්තාවෙහි ඇතුලත් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනාවකට අනුව අත්සන් කර ඇත.



**ආර්. ජේ ද සිල්වා මහතා**
*සභාපති*



**කේ. ටී. ඩී. ඩී ද සිල්වා මහත්මිය**
*සමාගම් ලේකම්*

# විගණකාධිපතිගේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | සීඑෆ්/බී/එච්ඩීඑෆ්අයිබී/ 1/ 15/25 | ඔබේ අංකය / உமது இல. / Your No. | |
| දිනය / திகதி / Date | 2016 මැයි 20 දින | | |

සභාපති,
ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

**ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 2003 අංක 15 දරන පනතින්ද, 2011 අංක 45 දරන පනතින්ද, සංශෝධිත 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකු පනතේ 26 (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

# විගණකාධිපතිගේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

2

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් බැංකුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**මතය**

මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව**

1988 අංක 30 දරන බැංකු පනතට සහ එයට පසුකාලීනව කරන ලද සංශෝධනයන් මගින් අවශ්‍ය කෙරෙන තොරතුරු මෙම මූල්‍ය ප්‍රකාශනවලින් ඉදිරිපත් කරනු ලබයි.

**පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීම**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු මාගේ වාර්තාව යථා කාලයේදී සභාගත කෙරෙනු ඇත.

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

# ලාභ හෝ අලාභ ප්‍රකාශනය

| 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා<br>(ශ්‍රී ලංකා රුපියල්) | සටහන් | බැංකුව<br>2015 | <br>2014 |
|---|---|---|---|
| **ආදායම** | | **4,909,069,496** | **4,566,125,682** |
| පොළී ආදායම | 1 | 4,660,182,745 | 4,377,844,809 |
| පොළී වියදම | 2 | (2,539,343,452) | (2,534,685,012) |
| **ශුද්ධ පොළී ආදායම** | | **2,120,839,292** | **1,843,159,796** |
| ගාස්තු සහ කොමිස් ආදායම | 3 | 253,108,354 | 211,424,163 |
| ගාස්තු සහ කොමිස් වියදම | | - | - |
| **ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම** | | **253,108,354** | **211,424,163** |
| ශුද්ධ වෙළෙඳ ආදායම/(වියදම) | | - | - |
| ලාභ අලාභ හරහා සාධාරණ අගයට නම් කළ මූල්‍ය උපකරණ වලින් ශුද්ධ ලාභය(අලාභය) | 4 | (16,263,402) | (9,871,302) |
| මූල්‍ය ආයෝජන වලින් ශුද්ධ ලාභය(අලාභය) | | - | - |
| වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ) | 5 | 12,041,800 | (13,271,987) |
| **මුළු මෙහෙයුම් ආදායම්** | | 2,369,726,044 | 2,031,440,670 |
| ණය සහ අනෙකුත් පාඩු සඳහා හානිකරණ ගාස්තු | 6 | 89,230,366 | 131,139,965 |
| **ශුද්ධ මෙහෙයුම් ආදායම්** | | 2,280,495,678 | 1,900,300,704 |
| **අඩුකලා: වියදම්** | | | |
| සේවක පිරිවැය | 7 | 828,657,754 | 671,192,234 |
| අස්පෘශ්‍ය වත්කම් හානිකරණය හා ක්‍රමක්ෂය | | | |
| වෙනත් වියදම් | 8 | 489,856,209 | 452,031,165 |
| **මුළු වියදම්** | | 1,318,513,962 | 1,123,223,399 |
| **එකතු කළ අගය මත බද්දට** (VAT) **පෙර මෙහෙයුම් ලාභය/(අලාභය)** | | 961,981,716 | 777,077,306 |
| අඩු කළා : මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද (VAT) | 9 | 174,978,661 | 142,492,347 |
| **එකතු කළ අගය මත බද්දට** (VAT) **පසු මෙහෙයුම් ලාභය/(අලාභය)** | | 787,003,055 | 634,584,959 |
| ආශ්‍රිත සහ බද්ධ සමාගම් වල ලාභ කොටස් | | - | - |
| **බදු පෙර ලාභය/(අලාභය)** | | 787,003,055 | 634,584,959 |
| බදු වියදම | 10 | 294,012,069 | 259,989,639 |
| **බදු පසු ලාභය/(අලාභය)** | | 492,990,986 | 374,595,320 |
| **ලාභ මත කොටසක ඉපයුම** | | | |
| මූලික කොටසක ඉපැයුම (රු.) | 11 | 7.62 | 5.79 |
| තාත්වීකරණ සාමාන්‍ය කොටසක ඉපැයුම (රු.) | | - | - |

# වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

| 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා (ශ්‍රී ලංකා රුපියල්) | බැංකුව 2015 | 2014 |
|---|---|---|
| **වර්ෂය සඳහා ලාභය** | **492,990,986** | **374,595,320** |
| **වෙනත් විස්තීර්ණ ආදායම්/(වියදම)** | | |
| දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණන සංචිතයේ වෙනස්වීම (සාධාරණ අගය විකල්පය භාවිතා කළේ නම්) | - | - |
| නිර්ණය කරන ලද ප්‍රතිලාභ සැලසුම් මත ආයුගණක අලාභ | 10,716,906 | (20,015,666) |
| ලාභ සහ අලාභ (විදේශීය මෙහෙයුම් වල මූල්‍ය ප්‍රකාශන පරිවර්තනය කිරීමෙන් ඇතිවූ) | - | - |
| විකිණීම සඳහා වූ මූල්‍ය වත්කම් නැවත මිනුම්කරණය මත ලාභ සහ අලාභ | - | - |
| වෙනත් මුදල් ප්‍රවාහ හුවමාරු ගිවිසුම් මත ලාභ සහ අලාභ | - | - |
| **බදු වලට ශුද්ධ වූ වර්ෂය සඳහා අනෙකුත් විස්තීර්ණ ආදායම්** | 10,716,906 | (20,015,666) |
| **වර්ෂය සඳහා සමස්ත විස්තීරණ ආදායම්** | **503,707,892** | **354,579,654** |
| **වෙන්කළ හැකි :** | | |
| කොටස් හිමියන්ට | 503,707,892 | 354,579,654 |
| පාලනය කළ නොහැකි හිමිකමට | - | - |
| **එකතුව** | **503,707,892** | **354,579,654** |

# මූල්‍ය තත්ත්ව විස්තරය

| 2015 දෙසැම්බර් 31 දිනට<br>(ශ්‍රී ලංකා රුපියල්) | සටහන් | බැංකුව<br>2015 | <br>2014 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ ඇති මුදල් සහ ශේෂයන් | 12 | 145,099,998 | 123,224,003 |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 13 | 55,687,587 | 425,456,328 |
| බැංකුවල ඇති ශේෂයන් | 14 | 63,070,732 | 164,301,732 |
| ගණුදෙනු කිරීම සඳහා පවතින මූල්‍ය වත්කම් | 15 | 2,043,353,937 | 850,381,869 |
| වෙනත් ගනුදෙනුකරුවන්ට ණය සහ ලැබිය යුතු දෑ | 16 | 26,684,610,922 | 23,356,508,363 |
| මූල්‍ය ආයෝජන- පරිණත වීම තෙක් රඳවා ගන්නා | 17 | 11,588,341,144 | 8,283,551,776 |
| දේපළ, පිරියත හා උපකරණ | 18 | 434,893,118 | 295,889,942 |
| ආයෝජන දේපළ | 19 | 786,350,000 | 777,648,500 |
| විලම්භිත බදු වත්කම් | 20 | - | 8,889,129 |
| වෙනත් වත්කම් | 21 | 111,546,873 | 131,878,083 |
| **මුළු වත්කම්** | | **41,912,954,310** | **34,417,729,726** |
| **වගකීම්** | | | |
| බැංකු සහ වෙනත් ආයතන සඳහා ගෙවිය යුතු දෑ | 22 | 3,031,112,418 | 4,225,673,914 |
| වෙනත් පාරිභෝගිකයින්ට ගෙවිය යුතු දෑ | 23 | 28,592,674,990 | 24,479,322,303 |
| නිකුත් කළ ණය සුරැකුම්පත් | 24 | 6,005,671,318 | 1,987,287,821 |
| ප්‍රවර්තන බදු වගකීම් | 25 | 257,247,956 | 271,035,110 |
| විලම්භිත බදු වගකීම් | 20 | 18,310,267 | - |
| වෙනත් වගකීම් | 26 | 644,112,754 | 568,544,008 |
| **මුළු වගකීම්** | | **38,549,129,704** | **31,531,863,156** |
| **හිමිකම** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 27 | 962,092,936 | 962,092,936 |
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | 28 | 114,617,816 | 89,968,266 |
| රඳවාගත් ඉපයුම් | 29 | 1,965,362,943 | 1,571,195,098 |
| වෙනත් සංචිත | 30 | 321,750,911 | 262,610,270 |
| කොටස් හිමියන්ගේ මුළු හිමිකම | | 3,363,824,606 | 2,885,866,571 |
| පාලනය කළ නොහැකි හිමිකම | | | |
| **මුළු හිමිකම** | | **3,363,824,606** | **2,885,866,571** |
| **මුළු හිමිකම හා වගකීම්** | | **41,912,954,310** | **34,417,729,726** |
| **අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්** | **31** | **742,928,019** | **584,769,154** |
| **කොටසක පොත් අගය (රු.)** | | **51.98** | **44.60** |

පිටු අංක 24 සිට 48 දක්වා සදහන් ගිණුම්කරන ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශන වල වැදගත් කොටසක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇත.

**ඩී. වී පතිරණ**
*ප්‍රධාන මූල්‍ය නිලධාරී*

**උපාලි හෙට්ටිආරච්චි**
*සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී*

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැඳේ. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් තබන ලද්දේ;

**ආර්. ජේ ද සිල්වා**
*සභාපති*

**ආර්. එච්. මීවක්කල**
*අධ්‍යක්ෂ*

දිනය :
කොළඹ

# ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| බැංකුව (000) (රු.) | ඡන්දය හිමි කොටස් ගණන | ප්‍රකාශිත ප්‍රාග්ධනය | පොදු සංචිත | ප්‍රත්‍යාගණන සංචිත | ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | විශේෂ සංචිත | ආයෝජන අරමුදල | රඳවාගත් ඉපැයුම් | එකතුව | පාලනය කළ නොහැකි හිමිකම | මුළු හිමිකම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2014.01.01 දිනට ශේෂය | 64,710,520 | 962,093 | 68,878 | 33,264 | 71,239 | 3,451 | 140,449 | 1,295,848 | 2,575,222 | - | 2,575,222 |
| වර්ෂය සඳහා සමස්ත විස්තීරණ ආදායම් | - | - | - | - | - | - | - | - | - | - | - |
| වර්ෂය සඳහා ලාභය/(අලාභය) | - | - | - | - | - | - | - | 374,595 | 374,595 | - | 374,595 |
| වර්ෂය සඳහා අනෙකුත් විස්තීර්ණ ආදායම් (බදු වලට ශුද්ධ වූ) | - | - | - | - | - | - | - | -46,897 | -46,897 | - | -46,897 |
| **වර්ෂය සඳහා සමස්ථ විස්තීරණ ආදායම්** | - | - | - | - | - | - | - | 327,698 | 327,698 | - | 327,698 |
| සෘජුවම හිමිකම තුළ හඳුනාගත් කොටස් හිමියන් සමඟ ගණුදෙනු | - | - | - | - | - | - | - | - | - | - | - |
| කොටස් නිකුතුන්/පවරන ලද ප්‍රාග්ධනයෙහි වර්ධනය | | | | | | | | | | | |
| ප්‍රසාද නිකුතු | - | - | - | - | - | - | - | - | - | - | - |
| හිමිකම් නිකුතු | - | - | - | - | - | - | - | - | - | - | - |
| කාලච්ඡේදය තුළ සංචිත වලට මාරු කිරීම් | - | - | 37,460 | - | 18,730 | - | - | -56,189 | - | - | - |
| ගෙවූ ලාභාංශ | - | - | - | - | - | - | - | -16,178 | -16,178 | | -16,178 |
| ප්‍රධාන කාර්යාලයට මාරු කළ ලාභ | - | - | - | - | - | - | - | - | - | - | - |
| දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය මත ලාභ/(අලාභ) (පිරිවැය ක්‍රමය යොදා ගත්තේ නම්) | - | - | - | -875 | - | - | - | - | -875 | - | -875 |
| වෙනත් | - | - | - | - | - | - | - | - | - | - | |
| **කොටස් හිමියන් සමඟ මුළු ගණුදෙනු** | - | - | 37,460 | -875 | 18,730 | - | - | -72,367 | -17,053 | - | -17,053 |
| **2014.12.31 දිනට ශේෂය** | 64,710,520 | 962,093 | 106,337 | 32,388 | 89,969 | 3,451 | 140,449 | 1,551,179 | 2,885,867 | - | 2,885,867 |

| බැංකුව (000) (රු.) | ඡන්දය හිමි කොටස් ගණන | ප්‍රකාශිත ප්‍රාග්ධනය | පොදු සංචිත | ප්‍රත්‍යාගණන සංචිත | ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | විශේෂ සංචිත | ආයෝජන අරමුදල | රඳවාගත් ඉපැයුම් | එකතුව | පාලනය කළ නොහැකි හිමිකම | මුළු හිමිකම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2015.01.01 දිනට ශේෂය | 64,710,520 | 962,093 | 106,337 | 32,388 | 89,969 | 3,451 | 140,449 | 1,551,179 | 2,885,867 | - | 2,885,867 |
| පෙර වර්ෂ ගැලපීම් | - | - | - | - | - | - | - | 13,952 | 13,952 | - | 13,952 |
| වර්ෂය සඳහා සමස්ත විස්තීරණ ආදායම් | - | - | - | - | - | - | - | - | - | - | - |
| වර්ෂය සඳහා ලාභය/(අලාභය) | - | - | - | - | - | - | - | 492,991 | 492,991 | - | 492,991 |
| වර්ෂය සඳහා අනෙකුත් විස්තීර්ණ ආදායම් (බදු වලට ශුද්ධ වූ) | - | - | - | - | - | - | - | 10,717 | 10,717 | - | 10,717 |
| **වර්ෂය සඳහා සමස්ථ විස්තීරණ ආදායම්** | - | - | - | - | - | - | - | 517,660 | 517,660 | - | 517,660 |
| සෘජුවම හිමිකම තුළ හඳුනාගත් කොටස් හිමියන් සමඟ ගණුදෙනු | - | - | - | - | - | - | - | - | - | - | - |
| කොටස් නිකුතුන්/පවරන ලද ප්‍රාග්ධනයෙහි වර්ධනය | - | - | - | - | - | - | - | - | - | - | - |
| ප්‍රසාද නිකුතු | - | - | - | - | - | - | - | - | - | - | - |
| හිමිකම් නිකුතු | - | - | - | - | - | - | - | - | - | - | - |
| කාලච්ඡේදය තුළ සංචිත වලට මාරු කිරීම් | - | - | 49,299 | - | 24,650 | - | -140,449 | 66,500 | - | - | - |
| ගෙවූ ලාභාංශ | - | - | - | - | - | - | - | -38,826 | -38,826 | | -38,826 |
| ප්‍රධාන කාර්යාලයට මාරු කළ ලාභ | - | - | - | - | - | - | - | - | - | - | - |
| දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය මත ලාභ/(අලාභ) (පිරිවැය ක්‍රමය යොදා ගත්තේ නම්) | | | | -875 | | | | | -875 | | -875 |
| වෙනත් | - | - | - | - | - | - | - | - | - | - | - |
| **කොටස් හිමියන් සමඟ මුළු ගණුදෙනු** | | | 49,299 | -875 | 24,650 | | -140,449 | 27,674 | -39,702 | | -39,702 |
| **2015-12-31 දිනට ශේෂය** | 64,710,520 | 962,093 | 155,636 | 31,513 | 114,619 | 3,451 | - | 2,096,513 | 3,363,825 | | 3,363,825 |

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා (රු.) | බැංකුව 2015 | 2014 |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | |
| පොළී ලැබීම් | 4,579,998,884 | 4,234,095,719 |
| පොළී ගෙවීම් | (2,506,970,442) | (2,385,694,895) |
| වෙනත් මෙහෙයුම් කටයුතු වලින් ලැබීම් | 244,523,942 | 277,096,872 |
| සේවකයින්ට සහ සැපයුම්කරුවන්ට මුදල් ගෙවීම් | (883,019,340) | (680,785,257) |
| වෙනත් මෙහෙයුම් කටයුතු මත ගෙවීම් | (419,276,894) | (393,491,211) |
| මෙහෙයුම් වත්කම් වල වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය | 1,015,256,150 | 1,051,221,228 |
| **මෙහෙයුම් වත්කම් වල (වැඩිවීම)/අඩුවීම** | | |
| ගණුදෙනුකරුවන්ගෙන් අයකරගත් අරමුදල් | 6,709,440,844 | 5,017,648,368 |
| ගණුදෙනුකරුවන්ට දුන් අත්තිකාරම් අරමුදල් | (10,089,546,808) | (8,693,617,023) |
| වෙනත් වත්කම් | 21,539,149 | 52,560,306 |
| | (3,358,566,815) | (3,623,408,349) |
| **මෙහෙයුම් වගකීම් වල වැඩිවීම/(අඩුවීම)** | | |
| ගණුදෙනුකරුවන්ගේ තැන්පතු | 4,125,887,291 | 5,427,052,591 |
| වෙනත් | 40,285,609 | (417,201,629) |
| | 4,166,172,900 | 5,009,850,961 |
| ආදායම් බදු වලට පෙර මෙහෙයුම් කටයුතු වලින් ශුද්ධ මුදල් | 1,822,862,235 | 2,437,663,840 |
| ආදායම් බදු සහ ගෙවූ ලාභාංශ බදු | (314,780,629) | (54,389,187) |
| මෙහෙයුම් කටයුතු වලින් ශුද්ධ මුදල් | 1,508,081,606 | 2,383,274,653 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | |
| ලද ලාභාංශ | 54,000 | 40,000 |
| ආයෝජන සුරැකුම්පත් විකිණීම/(මිලටගැනීම) | (4,113,558,346) | (3,240,522,472) |
| දේපල,පිරියත හා උපකරණ මිලට ගැනීම | (202,158,051) | (85,556,848) |
| දේපල,පිරියත හා උපකරණ විකිණීම | - | 5,609,850 |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් | (4,315,662,397) | (3,320,429,469) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | |
| කොටස් නිකුත් කිරීම/(නිදහස් කිරීම) | - | - |
| කොටස් ප්‍රාග්ධනය සඳහා දායකත්වය නිදහස් කිරීම | - | - |
| ණයගැනීම් නැවත ගෙවීම | (2,093,723,558) | (1,008,163,848) |
| ණයගැනීම් වලින් මුදල් ලැබීම | 4,875,210,006 | 1,966,497,420 |
| ගෙවූ ලාභාංශ | (38,826,312) | (16,177,630) |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් | 2,742,660,136 | 942,155,943 |
| මුදල් සහ මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම | (64,920,656) | 5,001,126 |
| කාලච්ඡේදය ආරම්භයේ මුදල් සහ මුදල් සමාන දෑ | 273,091,386 | 268,090,261 |
| කාලච්ඡේදය අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ | 208,170,729 | 273,091,387 |
| **මුදල් සහ මුදල් සමාන දෑ වල සැසඳීම** | | |
| අතැති මුදල් | 145,099,998 | 123,224,003 |
| බැංකුවේ ඇති මුදල් | 63,070,732 | 149,867,384 |
| | **208,170,729** | **273,091,387** |

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 1. සාංගමික තොරතුරු

### 1.1 වාර්තාකරණ ඒකකය

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව, සමාජය ගොඩනැගීම සඳහා 1956 ජාතික නිවාස පනතෙහි 11 වෙනි වගන්තිය යටතේ 1984 දී ශ්‍රී ලංකාවේ සංස්ථාපනය කරන ලදී. පසුව 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ සංස්ථාවක් බවට පරිවර්තනය කළ අතර 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනත යටතේ විශේෂිත බැංකු කාණ්ඩයට ඇතුලත් වීමට සහ 2011 අංක 45 දරන සංශෝධන පනත මගින් 1988 අංක 30 දරන බැංකු පනතේ උපලේඛන iv හි අඩංගු සියළුම ක්‍රියාකාරකම් සඳහා අයදුම්කිරීමට බලය ලැබිණි. HDFC බැංකුවේ ප්‍රධාන කාර්යාලය ජාතික නිවාස සංවර්ධන අධිකාරී ලේකම් කාර්යාලය, කොළඹ 02, ශ්‍රී ලංකාව යන ලිපිනයෙහි පිහිටා ඇත.

### 1.2 මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් වල ස්වභාවය

ආර්ථිකයේ සංවර්ධනය සඳහා විවිධ මූල්‍ය උපකාරයන් සමඟ තැන්පතු භාරගැනීම,සහ ණය ලබාදීම වැනි දෑ වර්ෂය තුළ සමූහ බැංකුවේ මූලික ව්‍යාපාරික ක්‍රියාකාරකම් විය.

## 2. සකස් කිරීමේ පදනම

### 2.1 අනුකූලතා ප්‍රකාශය

අවස්ථානුකූල අවශ්‍යතාවය මත ඓතිහාසික පිරිවැය පදනම මත සහ සාධාරණ අගය ගිණුම්කරනය අදාළ කරගනිමින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කළ ගිණුම්කරන ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, ආදායම් ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කර ඇත. මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත. සාමාන්‍යයෙන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන සියළුම විශේෂිත ව්‍යාපාර ඒකක වලට ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කරන ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතීන්ට අනුකූල වීම අනිවාර්ය වේ. සංසන්දනාත්මක අගයන්ද ඉහත ප්‍රමිත වලට අනුව නැවත වාර්තා කරනු ලැබේ.

### 2.2 ක්‍රියාත්මක වන සහ සකස් කිරීමේ මුදල් ඒකක

බැංකුවේ මෙහෙයුම් කටයුතු සිදුකරන ප්‍රාථමික ආර්ථික පරිසරයේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත 01 - "මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම" හි අවසරය පරිදි ඉදිරිපත් කරන වෙනස් අකාර වලට හැර අනෙක් සෑම අවස්ථාවකම අවසාන රුපියලට වටයා ශ්‍රී ලංකා රුපියල් වලින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලැබේ.

### 2.3 ගිණුම් සහ පෙර වර්ෂයේ අගයන් වල ආකෘතිය

ශ්‍රී ලංකා මහ බැංකුව නියම කළ ගිණුම් ආකෘතියකට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇති අතර ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත 01 - "මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම" හි අවසරය පරිදි පසුගිය වර්ෂයේ භාවිතා කළ ගිණුම්කරන ප්‍රතිපත්ති අඛණ්ඩව පවත්වාගෙන ඇත. සංශෝධනය කරන ලද මූල්‍ය ප්‍රකාශන වල අයිතම ඉදිරිපත් කරන විට සහ වර්ගීකරණය කරන විට වඩාත් හොඳ ඉදිරිපත් කිරීමක් සඳහා සංසන්දනාත්මක අගයන්ද නැවත වර්ගීකරණය කරනු ලැබේ.

## 3. ප්‍රමාණාත්මක ගිණුම්කරන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන

### 3.1 අඛණ්ඩ පැවැත්ම

බැංකුවේ කළමණාකාරිත්වය විසින් බැංකුව අඛණ්ඩ පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳව තක්සේරුවක් කර ඇති අතර පුරෝකථනය කල හැකි අනාගතයක් සඳහා ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට බැංකුව සතුව සම්පත් පවතින බවට සෑහීමකට පත්වී සිටී. තවද බැංකුවේ අඛණ්ඩ පැවැත්මේ හැකියාව පිළිබඳ යම් සැකයක් පලකරන ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයන් සම්බන්ධයෙන් කළමනාකාරිත්වය දැනුවත් නැත. එම නිසා මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම මත සකස් කර ඇත.

### 3.2 වත්කම් අගය කිරීම

#### *3.2.1 ගණුදෙනුකරුවන්ට ලබාදුන් ණය සහ අත්තිකාරම්*

අනාගතයේදී විය හැකි ණය පාඩු සඳහා හානිකරණයට පසු ශුද්ධ අගය මත ගණුදෙනුකරුවන්ට ලබාදුන් ණය සහ අත්තිකාරම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වාර්තා කරනු ලැබේ.

##### 3.2.1.1 හානිකරණ අලාභ සඳහා ප්‍රතිපාදන

ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත 39 - "මූල්‍ය උපකරණ: බැංකු තුළ මූල්‍ය උපකරණ හඳුනාගැනීම සහ මිනුම්කරණය" ට අනුව ගණුදෙනුකරුවන්ට ලබාදුන් ණය සහ අත්තිකාරම් අඛණ්ඩව සමාලෝචනය කිරීමේ පදනම මත විය හැකි හානිකරණ අලාභ සඳහා ප්‍රතිපාදන සිදුකරයි. අවශ්‍යතාවය මත පහත අගය කිරීමේ ක්‍රමවේද භාවිතා කොට ණය වල සාධාරණ අගය ගණනය කරනු ලැබේ.

01. සමූහ හානිකරණ ක්‍රමය
02. කේවල හානිකරණ ක්‍රමය

##### *3.2.1.1.1 සමූහ හානිකරණ ක්‍රමය*

ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත 39 - "මූල්‍ය උපකරණ: බැංකු තුළ මූල්‍ය උපකරණ හඳුනාගැනීම සහ මිනුම්කරණය" ට අනුව විය හැකි ණය අලාභ සඳහා සමූහ හානිකරණ ප්‍රතිපාදන සිදුකරනු ලැබේ. කේවල හානිකරණය ප්‍රමාණාත්මක නොවන විට බැංකුව අඩුවන අනුපාත යටතේ සමූහ හානිකරණ ප්‍රතිපාදන සිදුකරයි.

*3.2.1.1.1.1 උකස් සහ ඇපකාර ණය*

හානිකරණ ගැලපීම් සඳහා සැලකිය යුතු කාලසීමාවක් දක්වා කඩකල අඩුවන අනුපාතයක් භාවිතා කරයි. ශූන්‍ය කඩකරන්නන් සඳහා කිසිඳු ප්‍රතිපාදනයක් සිදුනොකරයි.

*3.2.1.1.1.2 මුදල් ආන්තික ණය*

බැංකුවේ අභිමතය පරිදි අයකර ගත හැකි මුදල් මත සැපයූ ණය නිසා මුදල් තැන්පතු ශේෂයක් මත සැපයූ ණය සඳහා කිසිඳු ප්‍රතිපාදනයක් සිදු නොකරයි.

*3.2.1.1.1.3 සේවක අර්ථසාධක අරමුදල් ණය*

සේවක අර්ථසාධක අරමුදල් ණය අගය කිරීම සඳහා සමූහ හානිකරණ ක්‍රමය භාවිතා කරන අතර ශූන්‍ය කඩකරන්නන් සඳහා කිසිඳු ප්‍රතිපාදනයක් සිදුනොකරයි. මාස 0 - 3 සිට 3 - 18 දක්වා වූ පරාසය සඳහා හිඟ ණය වෙනුවෙන් අඩුවන අනුපාත බැංකුව භාවිතා කරයි. කඩකල වර්ගීකරණය මාස 18 ට වැඩි නම් අදාළ වර්ගීකරණයට අදාළ වන්නා වූ අඩුවන අනුපාතය බැංකුව භාවිතා කරයි.

3.2.1.1.2 කේවල හානිකරණ ප්‍රතිපාදන

*3.2.1.1.2.1 අලෙවිය සඳහා දේපළ අත්පත් කරගැනීම*

ණය සහ අත්තිකාරම් තුළ ඇති ණය සඳහා සැලකිය යුතු කාලයක් පාරිභෝගිකයින් ගෙවීම් කඩ කළ හොත් ඍජු බැංකුවට ඇපයට තබන ලද දේපල වෙන්දේසි කරනු ලබන අතර වෙන්දේසිය තුල විකිණිය නොහැකි දේපල අත්පත් කරගත් දේපල ලෙස හඳුනාගනී. එම දේපල අගය කිරීම පහත පරිදි වේ. " ප්‍රමාණාත්මක සහතිකයකින් මූල්‍ය ප්‍රවාහය පුරෝකථනය කල හැකි නම් කේවල හානිකරණය ගණනය කරනු ලබයි ". මුදල් ප්‍රවාහය සඳහා සැලකිය යුතු සහතික කිරීමක් දිය නොහැකි නම් අත්පත් කරගත් දේපලට එරෙහිව ණය සඳහා 100% ක හානිකරණයක් සිදුකරයි.

*3.2.1.1.2.2 ව්‍යාපාති ණය*

ශූන්‍ය කඩකරන්නන් සඳහා කිසිඳු හානිකරණයක් සිදුනොකරන අතර මුදල් අයකරගැනීම සඳහා සැලකිය යුතු සහතිකයක් සහිත කඩකල ණය සඳහා කේවල හානිකරණය සිදුකරයි.

***3.2.2 මූල්‍ය ආයෝජන***

භාණ්ඩාගාර බිල්පත්, බැඳුම්කර සහ පරිණත වීම තෙක් රඳවා ගන්නා ආයෝජන පිරිවැය හා ලැබිය යුතු පොලිය මත වාර්තා කරන අතර අලෙවිය සඳහා ඇති ආයෝජන පිරිවැය හා ලැබිය යුතු පොලියට හානිකරණ ලාභ (අලාභ) ගැලපීම් මත වාර්තා කරයි.

***3.2.3 දේපල, පිරියත හා උපකරණ***

මූලික වශයෙන් පිරිවැය හා භාවිතයට සුදුසු තත්ත්වයට ගෙන ඒමට දරන වියදම් වල එකතුව මත හෝ ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත 16 අනුව වත්කමෙහි වටිනාකම සැලකිය යුතු ලෙස වෙනස් වී ඇත්නම් වසර තුනකට නොවැඩි නවතම ඇගයීම් වාර්තාවක් භාවිතා කොට සාධාරණ අගයට වාර්තා කරනු ලැබේ.

3.2.3.1 හඳුනාගැනීමේ පදනම

වත්කම හා බැඳි ආර්ථික ප්‍රතිලාභ අනාගතය තුල බැංකුවට ගලා ඒ නම් සහ වත්කමේ පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි නම් දේපල, පිරියත හා උපකරණ හඳුනාගැනීම සිදුකරයි.

3.2.3.2 මිනුම්කිරීමේ පදනම

වත්කම් එහි ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒමට සෘජුවම දරන ලද ඕනෑම පිරිවැයක් සමඟ වත්කමේ පිරිවැය මත ස්ථාවර වත්කම් වාර්තා කරනු ලැබේ. දේපල හා උපකරණ එහි පිරිවැයෙන් පහත විශේෂිත පදනම් යටතේ වූ සමුච්චිත ක්ෂය අඩුකළ අගය මත වාර්තා කරනු ලැබේ. ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත 16 - දේපල, පිරියත හා උපකරණ ප්‍රමිතියට අනුව මෙම දේපල වසර 3 - 5 අතර ප්‍රත්‍යාගණනය කරන ලදී.

3.2.3.3 ක්ෂය ප්‍රතිපත්තිය

විවිධ වත්කම් වල ඇස්තමේන්තුගත ජීවකාලය පුරා සරල මාර්ග ක්‍රමය මත පහත අනුපාත යටතේ ක්ෂය සම්පාදනය කරනු ලැබේ.

| **වත්කම් වර්ගය** | **වාර්ෂික %** |
|---|---|
| ගොඩනැගිලි | 6 2/3 |
| කාර්යාල උපකරණ | 12.5 |
| ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | 10 |
| මොටර් රථ සහ බයිසිකල් | 20 |
| පිරියත හා යන්ත්‍ර | 25 |
| උපාංග හා උපකරණ | 12.5 |
| පරිගණක උපකරණ සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර | 12.5 |
| පරිගණක මෘදුකාංග - විදේශීය | 25 |
| පරිගණක මෘදුකාංග - දේශීය | 25 |

භාවිතා කරන වර්ෂ සඳහා වාර්ෂිකව ක්ෂය සම්පාදන කරන අතර විකුණන වර්ෂය තුළ ක්ෂය සම්පාදනය නොකරයි. විවිධ වත්කම් වර්ග වල භාවිතයට ගත් දිනයේ සිට ක්ෂය ගණනය කිරීමේ ප්‍රායෝගික අපහසුතාවය සලකා ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත 16 හි 55 වගන්තියෙන් බැහැරව බැංකුව කටයුතු කර ඇත.

***3.2.4 ආයෝජන දේපළ***

ආයෝජන දේපල වර්තමාන වෙළෙඳපොල වටිනාකම මත වාර්තා කරන අතර ධාරණ අගය සහ වෙළෙඳපොල වටිනාකම අතර වෙනස ආදායම් ප්‍රකාශනයෙහි වෙනත් ආදායම් තුළ ඉදිරිපත් කරන අතර මූල්‍ය තත්ත්වය යටතේ වර්ග කරනු ලැබේ.

***3.2.5 ලාභ අලාභ හරහා සාධාරණ අගයට නම් කල මූල්‍ය වත්කම්.***

මේවාට ගණුදෙනු කල හැකි ණයකර ඇතුලත් වේ. සැලකිය යුතු කාලසීමාවන් තුළ ණයකර ගණුදෙනු වුයේ නම් එහි ගණුදෙනු මිල ණයකරයේ සාධාරණ අගය ලෙස සලකනු ලැබේ. අදාළ ණයකර සැලකිය යුතු කාලසීමාවක් තුල ගණුදෙනු නොවුයේ

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

නම් මාසයක පොළී අලාභය සාධාරණ අගය ගැලපුම් ලෙස සලකනු ලැබේ.

## 3.3 වගකීම් හා ප්‍රතිපාදන

### *3.3.1 වෙනත් ගණුදෙනුකරුවන්ට ගෙවිය යුතු අගයන්.*

මේ සඳහා පොළී හරිත තැන්පතු, ඉතුරුම් තැන්පතු, කාලීන තැන්පතු, ඉල්ලීම මත ගෙවිය යුතු තැන්පතු සහ තැන්පතු සහතික අයත් වේ. ඒවා ගෙවිය යුතු අගයන් මත මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තා කරනු ලැබේ. මෙම තැන්පතු සඳහා ගෙවිය යුතු පොළී ක්‍රමක්ෂය පිරිවැය පදනම යටතේ ආදායම් ප්‍රකාශනයට කපාහරින අතර අදාළ වගකීම් යටතේ ඉදිරිපත් කරයි.

### *3.3.2 ණය ගැනීම්*

ප්‍රතිමූල්‍ය ණය, මුදල් කැඳවීම් ණය සහ මූල්‍ය ආයතන වලින් ලබාගන්නා ණය ඇතුලත් ණයගැනීම් වල ඉතිරි ශේෂයේ දළ අගය පෙන්නුම් කරයි. ගෙවිය යුතු වට්නාකම් මත මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වාර්තා කරයි. මෙම ණය ගැනීම් සඳහා ගෙවිය යුතු පොළී ක්‍රමක්ෂය පිරිවැය පදනම යටතේ ආදායම් ප්‍රකාශනයට කපාහරිනු ලැබේ.

### *3.3.3 විශ්‍රාම ප්‍රතිලාභ*

3.3.3.1 විශ්‍රාම ප්‍රතිලාභ - නිර්ණය කල ප්‍රතිලාභ සැලසුම්

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ බැංකුවට සම්බන්ධ වූ කාලයේ සිට ගෙවිය යුතු විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසනු ලැබේ. ක්‍ෟඹ සාමූහික ගිවිසුමට අනුව වසර 15 කට වැඩි සේවා කාලයක් ඇති විශේෂ සේවකයින් සඳහා ආයුග ණක ඇගයීම යටතේ විශේෂ පාරිතෝෂික ප්‍රතිපාදන සිදුකරයි. මෙම අයිතමය මූල්‍ය තත්ත්ව විස්තරයෙහි වෙනත් වගකීම් යටතේ වර්ග කරනු ලැබේ.

3.3.3.2 විශ්‍රාම ප්‍රතිලාභ - නිර්ණය කල දායකත්ව සැලසුම්

*3.3.3.2.1 සේවක අර්ථසාධක අරමුදල*

සියළුම සේවකයින්ගේ වැටුප මත බැංකුව සහ සේවකයා පිළිවෙලින් 12% ක් හා 8% ක් වශයෙන් සේවක අර්ථසාධක අරමුදල සඳහා අර්ථසාධක අරමුදල කළමණාකරනය කරනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුවට ගෙවනු ලබයි.

*3.3.3.2.2 සේවක භාරකාර අරමුදල*

බැංකුව විසින් සෑම සේවකයෙකුගේ වැටුපින් 3% ක් සේවක භාරකාර අරමුදල කළමණාකරනය කරනු ලබන සේවක භාරකාර මණ්ඩලයට ගෙවනු ලබයි.

### *3.3.4 වෙනත් වගකීම්*

ගෙවිය යුතු පාරිතෝෂික/විශ්‍රාම වැටුප් ගාස්තු, වියදම් හා වට්නාකම්ද සහ වෙනත් ප්‍රතිපාදන වෙනත් වගකීම් වලට ඇතුලත් වේ. මූල්‍ය තත්ත්ව දිනට ගෙවීමට අපේක්ෂිත අගයන් මත මෙම වගකීම් වාර්තා කරනු ලැබේ.

## 3.4 ආදායම් හඳුනාගැනීම

### *3.4.1 ණය හා අත්තිකාරම් මත පොළී ආදායම*

සියළුම ණය සඳහා සඵල පොළී අනුපාත ක්‍රමය භාවිතා කොට උපචිත පදනමින් පොළී ආදායම හඳුනාගනී.

### *3.4.2 හිඟ පොළී ආදායම*

සේවක අර්ථසාධක ණය හැර අනෙක් ණය වාරික ගෙවීම් ප්‍රමාද වීම සඳහා හිඟ පොලිය මුදල් පදනම මත හඳුනාගනී.

## 3.5 වියදම

### *3.5.1 තැන්පතු, ණය මත පොලිය*

ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත 39 යෙහි විධි විධාන වලට අනුව තැන්පතු, ණය මත පොලිය සඵල පොළී අනුපාත ක්‍රමයට හඳුනාගන්නා අතර ආදායම් ප්‍රකාශනයට කපාහරී.

### *3.5.2 වෙනත් වියදම්*

සියළුම මෙහෙයුම් වියදම් සහ දේපල, පිරියත සහ උපකරණ ඵලදායී ලෙස පවත්වා ගැනීම සඳහා දරන ලද වියදම් වර්ෂයේ ලාභය හෝ අලාභය ගණනය කිරීමේ දී උපචිත පදනම මත ආදායම් ප්‍රකාශනයට කපාහරී.

### *3.5.3 බදුකරණය*

ආදායම් බදු වියදම ප්‍රවර්තන වර්ෂයේ ශුද්ධ බද්දෙන් සහ විලම්භිත බද්දෙන් සැදී ඇත. හිමිකම තුළ හඳුනාගත යුතු අවස්ථාවක සෘජුවම හිමිකම තුළ හඳුනාගන්නා අයිතම හැරුනු විට ආදායම් බදු වියදම් ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගනී.

3.5.3.1 ප්‍රවර්තන බදුකරණය

ප්‍රවර්තන හා පෙර වර්ෂ වලට අදාලව බදු අධිකාරීන්ගෙන් අය කරගැනීමට හෝ අධිකාරීන් වෙත ගෙවීමට අපේක්ෂා කරන වට්නාකම් වලින් ප්‍රවර්තන බදු වත්කම් හා වගකීම් සමන්විත වේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනට වලංගු බදු නීති සහ අනුපාත වලට අනුව වට්නාකම් ගණනය කිරීම සඳහා භාවිතා කරනු ලැබේ. ඒ අනුව 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතට සහ එහි සංශෝධන වලට අනුව බදුකරණ අරමුණු සඳහා ගලපන ලද වර්ෂය සඳහා ලාභය පදනම් කරගෙන බදුකරණය සඳහා ප්‍රතිපාදන සිදුකරන අතර ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත 12- " ආදායම් බදු" ට අනුව සටහන තුළ බදු වියදමෙහි ප්‍රධාන කොටස්, බලපවත්වන බදු අනුපාතය සහ බදු පෙර ලාභය සහ වියදම අතර සැසඳීමක් අඩංගු වේ.

3.5.3.2 විලම්භිත බදුකරණය

විලම්භිත බදුකරණය සඳහා වගකීම් ක්‍රමයට ප්‍රතිපාදන සම්පාදනය කරනු ලැබේ. බදුකරණය සඳහා වූ වර්තමාන අනුපාත යටතේ විලම්භිත බදු සඳහා ප්‍රතිපාදන තුළ මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගත් කාලච්ඡේදයට සාපේක්ෂව වෙනස්

කාලච්ඡේදයකදී ආදායම් බදු සඳහා ඉඩ දීම නිසා ඇතිවන කාල වෙනසෙහි බදු බලපෑම ඇතුලත් වේ.

#### 3.5.3.3 මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද

නිර්දේශ කල අනුපාත යටතේ ගණනය කල ක්ෂය ගැලපූ, සේවකයින් සඳහා ගෙවීම් සහ ආදායම් බදු වලට පෙර ගිණුම්කරන ලාභය මත පදනම්ව මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද ගණනය කරයි. මූල්‍ය ප්‍රකාශන වල කාලච්ඡේදය සඳහා ලාභය මත කපාහරින එකතු කළ අගය මත බදු වටිනාකම තීරණය කරනු ලැබේ.

### 3.6 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

මෙහෙයුම් කටයුතු, ආයෝජන කටයුතු සහ මූල්‍ය කටයුතු මත දළ මුදල් ලැබීම් සහ දළ මුදල් ගෙවීම් හඳුනාගෙන ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත 07 - " මුදල් ප්‍රවාහ ප්‍රකාශනය" ට අනුව "සෘජු ක්‍රමය" භාවිතා කොට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කර ඇත. දන්නා අගයකට පරිවර්තනය කළ හැකි සහ වටිනාකම වෙනස් වීමේ අඩු අවදානමක් ඇති කෙටි කාලීන ඉහළ ද්‍රවශීලතාවයෙන් යුක්ත ආයෝජන වලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

### 3.7 ව්‍යවස්ථාපිත සංචිත අරමුදල

ශ්‍රී ලංකා මහ බැංකු නියමයට අනුව සියළු බෙදාහැරීම් වලට පෙර බදු පසු ශුද්ධ ලාභයෙන් 5% ක් ව්‍යවස්ථාපිත සංචිත අරමුදලට මාරු කරනු ලබයි.

**පොදු සංචිත අරමුදල**

නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතට අනුව ලාභාංශ බෙදා හැරීමට පෙර බදු පසු ශුද්ධ ලාභයෙන් 10% ක් පොදු සංචිත අරමුදලට මාරු කරනු ලබයි.

### 3.8 සාමාන්‍ය කොටස් මත ලාභාංශ

සාමාන්‍ය කොටස් මත ලාභාංශ වගකීමක් ලෙස හඳුනාගන්නා අතර වාර්ෂික මහා සභා රැස්වීමේදී අනුමැතිය ලැබූ විට හිමිකමෙන් අඩු කරනු ලබයි.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනෙන් පසුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වාර්ෂික මහා සභා රැස්වීමේදී කොටස් හිමියන්ගේ අනුමැතිය සඳහා වර්ෂය සඳහා සාමාන්‍ය කොටස් මත ලාභාංශ නිර්දේශ කරන අතර ඒවා මූල්‍ය ප්‍රකාශන වල වෙන් වෙන්ව අනාවරණය කරනු ලැබේ.

### 3.9 කොටසක ඉපයුම

බැංකුවේ සාමාන්‍ය කොටස් හිමියන් සඳහා වෙන් කළ හැකි ලාභය හෝ අලාභය කාලච්ඡේදය තුළ පැවති සාමාන්‍ය කොටස් ගණනෙහි බර තබන ලද සාමාන්‍යයෙන් බෙදා මූලික කොටසක ඉපයුම ගණනය කරනු ලැබේ. සාමාන්‍ය කොටස් හිමියන් සඳහා වෙන් කළ හැකි ලාභය හෝ අලාභය කාලච්ඡේදය තුළ පැවති සාමාන්‍ය කොටස් ගණනෙහි බර තබන ලද සාමාන්‍යයට විය හැකි සියළු තනුක අවස්ථාවන් ගලපා බෙදීමෙන් තනුක කොටසක ඉපයුම ගණනය කල හැකිය.

### 3.10 තොග අගය කිරීම

පාරිභෝජනය කල හැකි තොග පිරිවැය මත වාර්තා කරන අතර තොග අයිතම නිකුත් කිරීම පෙර පිවිසි පෙර නිකුතු ක්‍රමයට සිදු කරයි.

### 3.11 අනෙක් ඒකක සඳහා බැඳීම

ශේෂ පත්‍ර දිනට අනෙක් ඒකක සඳහා කිසිඳු සැලකිය යුතු බැඳීමක් නොතිබිනි.

### 3.12 නිකුත් කල නමුත් අදාළ කර නොගත් නව ගිණුම්කරන ප්‍රමිතීන්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද පහත ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතීන් 2015 ජනවාරි 01 දින හෝ ට පසුව ආරම්භ වන කාලච්ඡේද සඳහා බලපැවැත්වේ.

i. **ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 09 - මූල්‍ය උපකරණ**

මෙම ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියේ අරමුණ වන්නේ ව්‍යාපාර ඒකකයෙහි අනාගත මුදල් ප්‍රවාහ වල වටිනාකම්, කාලසීමාවන් සහ අවිනිශ්චිතභාවයන් පිළිබඳ මූල්‍ය ප්‍රකාශන පරිශීලනය කරන්නන්ට ඔවුන්ගේම තක්සේරුවක් සිදුකිරීමට අදාළ සහ අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමට මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් වල මූල්‍ය වාර්තාකරණය සඳහා මූලධර්ම ස්ථාපිත කිරීමයි. මෙම ප්‍රමිතිය බලපැවැත්වෙන දිනය 2018 ජනවාරි 01 දින තෙක් ප්‍රමාද කරන ලදී.

ii. **ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 15 - ගණුදෙනුකරුවන් සමඟ ගිවිසුම් තුළින් ආදායම්**

මෙම ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියේ අරමුණ වන්නේ ආදායම කොපමණ ප්‍රමාණයකින් කවදා හඳුනාග න්නේද යන්න තීරණය කිරීමට සවිස්තරාත්මක විෂය පථයක් ස්ථාපිත කිරීමයි. මෙම ප්‍රමිතිය 2017 ජනවාරි 01 දින හෝ ඊට පසුව සකස් වන වාර්ෂික වාර්තා සඳහා බලපැවැත්වේ.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 1 පොළී ආදායම

| රු. | 2015 | 2014 |
|---|---|---|
| **පොළී ආදායම** | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 39,694,272 | 18,741,876 |
| බැංකු වල ශේෂ | - | - |
| ව්‍යුත්පන්න | - | - |
| ගණුදෙනු කිරීම සඳහා තබාගන්නා මූල්‍ය වත්කම් | 87,172,274 | 10,803,514 |
| ලාභ අලාභ හරහා සාධාරන අගයට නම් කළ මූල්‍ය වත්කම් | - | - |
| බැංකුවලට ණය සහ ලැබිය යුතු දෑ | - | - |
| වෙනත් ගණුදෙනුකරුවන්ට ණය සහ ලැබිය යුතු දෑ | 3,914,187,244 | 3,704,718,926 |
| මූල්‍ය ආයෝජන - පරිණත වීම තෙක් තබාගන්නා | 619,128,955 | 643,580,493 |
| මූල්‍ය ආයෝජන - අලෙවිය සඳහා ඇති | - | - |
| වෙනත් | - | - |
| **මුළු පොළී ආදායම** | **4,660,182,745** | **4,377,844,809** |

## 2 පොළී වියදම

| රු. | 2015 | 2014 |
|---|---|---|
| බැංකු වලට හිඟ ශේෂ | 97,624,960 | 64,529,141 |
| ව්‍යුත්පන්න | - | - |
| ලාභ අලාභ හරහා සාධාරන අගයට නම් කළ මූල්‍ය වගකීම් | - | - |
| වෙනත් ගණුදෙනුකරුවන්ට හිඟ ශේෂ | 1,998,587,384 | 2,095,079,747 |
| නිකුත් කළ ණය සුරැකුම්පත් | 307,960,169 | 307,947,362 |
| වෙනත් ණය ගැනීම් | 135,170,939 | 67,128,762 |
| **මුළු පොළී වියදම** | **2,539,343,452** | **2,534,685,012** |

## 3 ගාස්තු, කොමිස් ආදායම් සහ වෙනත්

| රු. | 2015 | 2014 |
|---|---|---|
| ගාස්තු හා කොමිස් ආදායම් | 253,108,354 | 211,424,163 |
| වෙනත් | - | - |
| **ගාස්තු හා කොමිස් ආදායම්** | **253,108,354** | **211,424,162** |
| ගිවිසීම | | |
| ණය | 216,813,756 | 181,931,192 |
| කාඩ්පත් | - | - |
| වෙළෙඳ සහ ප්‍රේෂණ | - | - |
| ආයෝජන බැංකුකරණය | - | - |
| තැන්පතු | - | - |
| ඇපවීම් | - | - |
| වෙනත් * | 36,294,598 | 29,492,971 |
| **ගාස්තු හා කොමිස් ආදායම්** | 253,108,354 | 211,424,163 |

## 4 ලාභ අලාභ හරහා සාධාරන අගයට නම් කළ මූල්‍ය උපකරණ වලින් ශුද්ධ ලාභ/(අලාභ)

| රු. | 2015 | 2014 |
|---|---|---|
| **ණයකර ආයෝජනයෙන් ශුද්ධ අලාභය** | (15,013,402) | (9,871,302) |
| **ඒකක භාර වලින් ශුද්ධ අලාභය** | (1,250,000) | - |
| **එකතුව** | (16,263,402) | (9,871,302) |

## 5 වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ)

| රු. | 2015 | 2014 |
|---|---|---|
| ආයෝජන දේපළ ප්‍රත්‍යාගණන ලාභ/(අලාභ) | 12,481,500 | (20,196,500) |
| ආයෝජන දේපළ විකිණීම මත ලාභ/(අලාභ) | (439,700) | 6,924,513 |
| වෙනත් | - | - |
| **වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ)** | **12,041,800** | **(13,271,987)** |

## 6 ණය සහ වෙනත් අලාභයන් සඳහා හානිකරණ ගාස්තු

| රු. | 2015 | 2014 |
|---|---|---|
| ණය සහ ලැබිය යුතු දෑ | | |
| බැංකුවලට | - | - |
| වෙනත් ගණුදෙනුකරුවන්ට | 89,230,366 | 131,139,965 |
| වෙනත් | - | - |
| **එකතුව** | 89,230,366 | 131,139,965 |
| **6.1 වෙනත් ගණුදෙනුකරුවන්ට** | | |
| කේවල හානිකරණය | 255,382 | 1,995,315 |
| සමූහ හානිකරණය | 88,974,983 | 129,144,650 |
| **එකතුව** | 89,230,366 | 131,139,965 |

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

### 7 සේවක පිරිවැය

| රු. | 2015 | 2014 |
|---|---|---|
| **වැටුප් සහ අදාළ වියදම්** | | |
| වැටුප් සහ ප්‍රසාද දීමනා | 599,910,289 | 438,538,120 |
| සේවක ණය ප්‍රතිලාභ | 42,956,900 | 33,408,152 |
| සේවක වෛද්‍ය | 28,984,670 | 27,278,314 |
| අතිකාල සහ නිලධාරී දීමනා | 12,332,920 | 8,824,882 |
| වාර්ෂික නිවාඩු මුදල් කිරීම | 14,552,470 | 13,320,053 |
| දිරි දීමනා ගෙවීම් | 11,958,132 | 9,945,765 |
| **අනු එකතුව** | 710,695,380 | 531,315,286 |
| **විශ්‍රාම ප්‍රතිලාභ** | | |
| නිර්ණය කරන ලද දායකත්ව සැලසුම් වලට දායකවීම් | 69,574,757 | 53,664,346 |
| නිර්ණය කරන ලද ප්‍රතිලාභ සැලසුම් වලට දායකවීම් | 48,387,617 | 86,212,601 |
| **අනු එකතුව** | 117,962,374 | 139,876,948 |
| **එකතුව** | 828,657,754 | 671,192,234 |

#### 7.1 ඉහළ කළමණාකරනය සඳහා පාරිශ්‍රමික

| | | |
|---|---|---|
| ඉහළ කළමණාකරනය සඳහා මුළු පාරිශ්‍රමික | 50,459,298 | 23,173,261 |
| **එකතුව** | **50,459,298** | **23,173,261** |

### 8 වෙනත් වියදම්

| රු. | 2015 | 2014 |
|---|---|---|
| අධ්‍යක්ෂවරුන්ගේ වේතන | 1,766,320 | 1,818,600 |
| විගණකයින්ගේ පාරිශ්‍රමික | 685,200 | 633,200 |
| වෘත්තීය වියදම් | 2,977,831 | 4,645,753 |
| නෛතික වියදම් | 514,135 | 415,722 |
| දේපළ, පිරියත හා උපකරණ ක්ෂයt | 68,133,701 | 68,479,115 |
| කල්බදු දේපළ ක්‍රමක්ෂය | 364,642 | 364,642 |
| විදුලිය හා ජලය | 25,467,491 | 26,185,209 |
| දුරකථන ගාස්තු | 23,733,588 | 20,523,949 |
| පරිගණක නඩත්තු | 24,335,569 | 20,330,591 |
| කුළී | 62,692,471 | 53,507,496 |
| අළුත්වැඩියා සහ නඩත්තු | 6,404,211 | 5,285,132 |
| ව්‍යාපාර සංවර්ධන සහ ප්‍රචාරණ | 52,085,291 | 41,921,179 |
| වෙනත් කාර්යාල පරිපාලන සහ ආයතනික වියදම් | 220,695,760 | 207,920,578 |
| **එකතුව** | 489,856,209 | 452,031,165 |

## 9 මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු

| රු. | 2015 | 2014 |
|---|---|---|
| මුළු එකතු කළ අගය | 1,615,048,507 | 1,259,653,455 |
| මූල්‍ය සේවා සඳහා ආරෝපණය කල හැකි එකතු කළ අගය | 1,536,954,427 | 1,207,723,595 |
| මූල්‍ය එකතු කළ අගය මත බදු % | 11% | 12% |
| වර්ෂය සඳහා මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු | 169,064,987 | 144,926,832 |
| පසුගිය වර්ෂයේ ඌනන (අධි) වෙන්කිරීම | 5,913,674 | (2,434,484) |
| **එකතුව** | **174,978,661** | **142,492,348** |

## 10 බදු වියදම

| රු. | 2015 | 2014 |
|---|---|---|
| ප්‍රවර්තන බදු වියදම | | |
| ප්‍රවර්තන වර්ෂය | 266,812,673 | 256,356,837 |
| පෙර වර්ෂවල වෙන්කිරීම | - | - |
| විලම්භිත බදු වියදම | 27,199,396 | 3,632,801 |
| **එකතුව** | **294,012,069** | **259,989,639** |

### 10.1 බදු වියදම සැසඳීම

| රු. | 2015 | 2014 |
|---|---|---|
| ගිණුම්කරන ලාභය | 961,981,716 | 777,077,306 |
| එකතුකළා: ඉඩනොදෙන වියදම් | 339,081,117 | 377,629,082 |
| අඩුකළා : ඉඩදෙන වියදම් | 348,160,428 | 239,146,254 |
| ගැලපූ බදු පෙර ලාභය | 952,902,405 | 915,560,134 |
| 28% යටතේ ආදායම් බදු | 266,812,673 | 256,356,837 |
| එකතු කළ අගය මත බද්දට පසු ගිණුම්කරන ලාභය | 787,003,055 | 634,584,959 |
| බලපැවැත්වෙන බදු අනුපාතය | 33.90% | 40.40% |

### 10.2 ගිණුම්කරන ආදායම සහ බදු වියදම අතර සබඳතාවය

| | | |
|---|---|---|
| ආදායම් ප්‍රකාශනය අනුව බදු පෙර ලාභය | 961,981,716 | 777,077,306 |
| එකතුකළා: ඉඩනොදෙන වියදම් | 339,081,117 | 377,629,082 |
| අඩුකළා : ඉඩදෙන වියදම් | 348,160,428 | 239,146,254 |
| බද්දට යටත් ආදායම | 952,902,405 | 915,560,134 |
| 28% යටතේ බදු | 266,812,673 | 256,356,837 |
| ඌනන (අධි) වෙන්කිරීම | - | - |
| අඩුකළා : විලම්භිත බදු ගැලපීම | 27,199,396 | 3,632,801 |
| ආදායම් බදු සඳහා වෙන්කිරීම | 294,012,070 | 259,989,639 |

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

### 10.3 ආදායම් ප්‍රකාශනයෙහි විලම්භිත බදු (බැර)/කපාහැරීම් පහත පරිදි අඩංගු වේ

| රු. | 2015 | 2014 |
|---|---|---|
| විලම්භිත බදු වත්කම් | 9,022,831 | 41,689,697 |
| විලම්භිත බදු වගකීම් | 36,222,228 | 45,322,498 |
| වෙනත් තාවකාලික වෙනස්වීම් | - | - |
| ආදායම් ප්‍රකාශනයට විලම්භිත බදු (බැර)/කපාහැරීම් | (27,199,396) | (3,632,801) |

### 11 කොටසක ඉපයුම

| රු. | 2015 | 2014 |
|---|---|---|
| සාමාන්‍ය කොටස් හිමියන් සඳහා වෙන්කළ හැකි ශුද්ධ ලාභය | 492,990,986 | 374,595,320 |
| තනුකයන්හි බලපෑම ගැලපූ සාමාන්‍ය කොටස් හිමියන් සඳහා වෙන්කළ හැකි ශුද්ධ ලාභය | 492,990,986 | 374,595,320 |
| මූලික කොටසක ඉපයුම සඳහා සාමාන්‍ය කොටස් ගණනෙහි බර තබන ලද සාමාන්‍ය | 64,710,520 | 64,710,520 |
| **මූලික කොටසක ඉපයුම (රු.)** | 7.62 | 5.79 |
| **තනුක කොටසක ඉපයුම (රු.)** | - | - |

### 12 ශ්‍රී ලංකා මහ බැංකුවේ ඇති මුදල් සහ ශේෂයන්

| රු. | 2015 | 2014 |
|---|---|---|
| අතැති මුදල් | 145,099,998 | 123,224,003 |
| එකතුව | 145,099,998 | 123,224,003 |

### 13 ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්

| රු. | 2015 | 2014 |
|---|---|---|
